


# හඬ නගමු - ක්‍රියාත්මක වෙමු

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ලිංගිකත්වය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම හා අවම කිරීමේ ක්‍රමවේද සඳහා පළාත් පාලන ආයතන වල කාන්තා කමිටු සාමාජිකයන් වෙනුවෙන් සකස් කරන ලද පුහුණු කිරීමේ අත්පොත

FSLGA
FEDERATION OF SRI LANKAN LOCAL GOVERNMENT AUTHORITIES

FCM FEDERATION OF CANADIAN MUNICIPALITIES FÉDÉRATION CANADIENNE DES MUNICIPALITÉS

In partnership with Canada

# ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ලිංගිකත්වය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම හා අවම කිරීමේ ක්‍රමවේද සඳහා පළාත් පාලන ආයතන වල කාන්තා කමිටු සාමාජිකයන් වෙනුවෙන් සකස් කරන ලද පුහුණු කිරීමේ අත්පොත

# පටුන


පිටු අංක

පූර්විකාව.....03
ස්තුතිය .....03
කෙටි වදන්.....03
හැඳින්වීම.....04

පුහුණු කාලසටහන ..... 05

1 වන සැසිය .....07
සැසියේ සැලැස්ම .....07
1.1 සැසිය - සැසිය ඇරඹුම .....07
1.2 සැසිය - ඔබ කවදා හෝ? .....08

2 වන සැසිය.....09
2.1 සැසිය - ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය - වෙනස හඳුනා ගැනීම.....09
2.2 සැසිය - බලය, බලහත්කාරකම සහ කැමැත්ත..... 11
2.3 සැසිය - මානව හිමිකම්.....16
2.4 සැසිය - වින්දිතයන් හා චූදිතයන් .....17
2.5 සැසිය - ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය නිර්වචනය කිරීම..19

3 වන සැසිය .....22
3.1 සැසිය - ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ විවිධ ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියා.23
3.2 සැසිය - බලපාන සාධක සහ හේතු.....26
3.3 සැසිය - අවම කිරීමේ ක්‍රමෝපායන් .....29
3.4 සැසිය - ප්‍රචණ්ඩත්වයට මුහුණදීමේ ප්‍රතිඵල.....31
3.5 සැසිය - ප්‍රතිචාර දැක්වීමේ සේවාවන්.....34
3.6 සැසිය - විවිධ ක්ෂේත්‍රයන් තුළින් ගත හැකි පියවර සඳහා වූ ප්‍රවේශය.....36
3.7 සැසිය - යොමු කළ යුතු ස්ථානවලට වාර්තා කිරීමේ ක්‍රමවේදය සකස් කිරීම.....38

## පූර්විකාව

ලොව පුරා වාර්තා වී ඇති මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ අවස්ථාවන් සැලකිල්ලට ගත් කළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදු කරනු ලබන ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් ප්‍රමුඛ ස්ථානයක් ගනියි. එමගින් පුද්ගලයන්ට, පවුල, සහ ප්‍රජා කණ්ඩායම්වලට දැඩි බලපෑම් ඇතිව තිබේ. සිය බල ප්‍රදේශයේ ජනතාවගේ සුබ විහරණ සලසන සමීපතම පාලන ඒකකය ලෙස පළාත් පාලන ආයතනයට එවැනි ප්‍රචණ්ඩකාරී තත්වයන් අවම කිරීමට අවශ්‍යය පියවර ගැනීමේ වගකීමක් ඇත.

## පළාත් පාලන ආයතනවල කාන්තා උපදේශක කමිටු

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳව ක්‍රමානුකූල හැදෑරීම, එම තත්වයන් අවම කර ගැනීම පහසුකරණය සඳහා අවශ්‍යය උපදෙස් සහ මෙවලම් ආදිය ලබාදීම මගින් සිය බල ප්‍රදේශයේ පවතින එවැනි ප්‍රචණ්ඩකාරී තත්වයන් අවම කිරීම සඳහා පළාත් පාලන ආයතනවල ස්ථාපිත කාන්තා උපදේශක කමිටුවට මූලිකත්වය ගෙන ක්‍රියා කළ හැකිය. මෙම අත්පොත පිළියෙල කර ඇත්තේ වැඩමුළු, ප්‍රජා සංවාද, දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගිත්ව සංකල්පය සහ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට උපකාරී මෙවලමක් ලෙස භාවිතා කිරීමටයි.

මෙම අත්පොත විවිධ වූ පාර්ශවකරුවන්ගේ සාමූහික මැදිහත්වීම මත ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය අවම කිරීම, එවැනි තත්ත්වයට භාජනය වූ තැනැත්තන් සුරැකීම සහ අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීම යන කරුණු සැලකිල්ලට ගෙන ඇත. එම ප්‍රවේශයන් මගින් වඩාත් සුරක්ෂිත ප්‍රජාවක් ගොඩනැගීමට හැකිවේ යන්න අපි අපේක්ෂා කරමු.

## ස්තූතිය

මෙම අත්පොත පිළියෙල කරන ලද්දේ ප්‍රාදේශීය නායිකාවන් බල ගැන්වීම තුළින් පළාත් පාලන සේවාවන් නව්‍යකරණය Partnerships for Municipal Innovation - Women in Local Leadership (PMI-WILL) ව්‍යාපෘතියේ අනුග්‍රහයෙනි. මෙහි දී කැනේඩියානු රජය විසින් ලබාදුන් මූල්‍යාධාර මෙන්ම කැනේඩියානු පළාත් පාලන සංසදය විසින් ලබා දුන් තාක්ෂණික සහයෝගය අපට මහඟු පිටුවහලක් විය. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්ෂේත්‍රය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අන්තර්කරණය කිරීම ප්‍රවර්ධනය සඳහා ඔවුන් ලබාදෙන සහයෝගය අපි අගය කරමු. එමෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය අවම කිරීමට අඛණ්ඩව ක්‍රියාකරන සියලු පාර්ශවකරුවන්ට අපගේ ස්තූතිය පිරිනමමු.

## කෙටි හැඳින්වීම්

- **CEDAW** - Convention on the Elimination of All Forms of Discrimination Against Women - කාන්තාවන් සඳහා වූ සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් ඉවත් කිරීමේ සම්මුතිය
- **CSO** - සිවිල් සමාජ සංවිධාන Civil Society Organization
- **FGM** - කාන්තා ලිංගඡේදනය Female Genital Mutilation
- **GBV** - ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් වූ ප්‍රචණ්ඩත්වය Gender-Based Violence
- **NGO** - රාජ්‍යය නොවන සංවිධාන Non-Governmental Organization
- **PWD** - ආබාධිත පුද්ගලයන් Persons with Disabilities
- **SGBV** - ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය Sexual and Gender-Based Violence

# හැඳින්වීම

ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වය ගෝලීය වශයෙන් ද පැවැතෙන ඉතාමත් සංකීර්ණ ගැටළුවකි. මේ සඳහා පුළුල් පරාසයක් නියෝජනය කරන ක්‍රියාකාරීන්ගේ අවධානය යොමු විය යුතුය. ශ්‍රී ලංකාවේ ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත විෂය භාර නිලධාරීන්, රාජ්‍යය නොවන සංවිධාන, නීති ආධාර ලබා දෙන ආයතන, පොලිස් ස්ථානවල කාන්තාවන් සඳහා කටයුතු කරන නිලධාරීන් ඇතුළු විවිධ ආයතන සහ පුද්ගලයන් මෙම සංකීර්ණ ගැටළුව පිළිබඳව කටයුතු කළත් පවතින සංස්කෘතික හා සමාජ වටපිටාව හේතුවෙන් මෙවැනි තත්වයන්ට මුහුණපාන පිරිස් නිවැරදිව සහ කඩිනමින් ඒ පිළිබඳව පියවර ගැනීමට පසුබට වී තිබේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව ඇතිවන ප්‍රචන්ඩත්වයට කඩිනම් ප්‍රතිචාර දැක්වීම ප්‍රමාදවන හේතු

1) ප්‍රචණ්ඩකාරී ක්‍රියා පිළිබඳ අවබෝධයක් නොමැති වීම

2) ඒ සඳහා ගත හැකි නීතිමය හෝ අනෙකුත් ආධාර හා පියවර පිළිබඳ දැනීමක් නැතිකම.

3) ලිංගිකත්වය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය අවම කිරීමට අවශ්‍යය සමාජ ජාලා ආදිය නොමැති වීම.

පළාත් පාලන ආයතන තුළ ස්ථාපිත කාන්තා උපදේශක කමිටු සමාජිකයින්ට අවශ්‍යය දැනුම ලබාදීම සඳහා මෙම පුහුණු අත්පොත පිලියෙල කර ඇත. මෙම කමිටු මගින් ප්‍රචණ්ඩත්වයට භාජනය වන වින්දිතයන් සඳහා සමාජ ජාලයක් ලෙස ක්‍රියාත්මක වනු ලබන අතර ඔවුන් අවශ්‍යය නීතිමය හෝ මනෝ චිකිත්සක උපදෙස් සේවා ලබාදීමට යොමු කිරීම වැනි කටයුතු කිරීමට පියවර ගනු ලබයි. මෙම අත්පොත ආශ්‍රිත පුහුණුවේ අරමුණ වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාදීම හා සිය බල ප්‍රදේශයේ එවැනි තත්වයන් අවම කර ගැනීම සඳහා ගත හැකි පියවර සකස් කිරීමයි.

මෙම පුහුණු අත්පොත සකස් කර ඇත්තේ දින එකහමාරක (1.5) සැසියක් සඳහාය. මෙහිදී ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ පැහැදිලි අවබෝධයක් මෙන්ම එවැනි අවස්ථා අවම කිරීමට අවශ්‍යය ක්‍රමෝපායන් සකස් කිරීමටද අවශ්‍යය උපදෙස් ලබාදී ඇත.

ඉලක්ක කණ්ඩායම -
පළාත්පාලන ආයතන තුළ ස්ථාපිත කාන්තා උපදේශක කමිටු සාමාජිකයන්

## පුහුණු කාල සටහන

### පළමු දිනය

| සැසිය | වේලාව | |
|---|---|---|
| ලියාපදිංචිය සහ සංග්‍රහය | 09.30 - 09.45 | |
| 1.1 සැසිය ආරම්භ කිරීම | 09.45 - 10.00 | වැඩමුළුව පිළිබඳ හැඳින්වීම |
| 1.2 ඔබ කවදා හෝ? | 10.00 - 10.30 | පුහුණුකරු විසින් සහභාගිවන්නන්ගේ පසුබිම හඳුනාගැනීම |
| 2.1 ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ හැඳින්වීම | 10.30 - 11.15 | ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස හඳුනාගැනීම |
| 2.2 බලය, බලය යෙදීම සහ කැමැත්ත | 11.15 - 11.45 | |
| 2.3 මානව හිමිකම් | 11.45 - 12.15 | |
| 2.4 වින්දිතයන් සහ චූදිතයන් | 12.15 - 13.00 | |
| 2.5 ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ නිර්වචනය | 13.00 - 13.30 | |
| 3.0 බල ප්‍රදේශයේ ප්‍රචණ්ඩත්වයට තුඩු දෙන හේතුන්, වර්තමාන තත්ත්වය පිළිබඳව සාකච්ඡාව | 13.30 - 14.00 | |
| සැසිය අවසානය සහ දිවා ආහාරය | | |

### දෙවන දිනය

| සැසිය | වේලාව | |
|---|---|---|
| තේ පැන් සංග්‍රහය | 09.00 - 09.30 | |
| 3.1 ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය | 09.30 - 10.00 | පෙර දින සැසිය පිළිබඳ ආවර්ජනය |
| 3.2 ප්‍රචන්ඩත්වයට හේතුවන කරුණු | 10.00 - 10.15 | |
| 3.3 ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ක්‍රමෝපායන් | 10.15 - 11.15 | |
| 3.4 ප්‍රචණ්ඩත්වයට භාජනය වීමෙන අනතුරුව බලපාන කරුණු | 11.15 - 11.45 | |
| 3.5 ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමෝපායන් | 11.45 - 11.55 | |
| 3.6 විවිධ පරාසයන් ඔස්සේ ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේද | 11.55 - 12.15 | |
| 3.7 ප්‍රචණ්ඩත්වය පිළිබඳව වාර්තා කිරීමේ ක්‍රමවේදය සකස් කිරීම | 12.15 - 13.15 | |
| 4.0 සැසිය අවසන් කිරීම සහ ඉදිරි පියවර | | |

# ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය

## සැසිය ඇරඹීමට පෙර අනුගමනය කළ යුතු පියවර

කාලය - විනාඩි 15

අරමුණ - ඵලදායි වැඩමුළුවක් පැවැත්වීම

ක්‍රමවේදය

1. පහත දැක්වෙන පියවර අනුගමය කිරීමෙන් සහභාගීවන පිරිසට වඩාත් ඵලදායි වැඩමුළුවක් පැවැත්වීමට හැකි බව පැහැදිලි කරන්න.
2. ෆ්ලිප්චාට් කඩදාසියක හෝ මල්ටි මීඩියා ස්ලයිඩ් එකක් මගින් පහත දැක්වෙන කරුණු සඳහන් කර පැහැදිලි කරන්න.
   - ජංගම දුරකතනය ක්‍රියා විරහිත කිරීම හෝ ශබ්දය අවම කිරීම.
   - කාලය පිළිබඳව අවධානය යොමු කිරීම - නියමිත වෙලාවට ඇරඹීම සහ අවසන් කිරීම.
   - සහභාගීවන්නන් එකිනෙකාට සහ සම්පත්දායකයාට ගරු කිරීම.
   - එක් වරකදී එක් තැනැත්තකු පමණක් කතා කිරීම.
   - රහස්‍යයභාවය සුරැකීම.
   - ක්‍රියාකාරී සහභාගීත්වය.
3. ඉහත කරුණුවලට අමතරව යම් අදහස් ඇතිදැයි සහභාගීවන්නන් ගෙන් විමසන්න.

## සම්පත්දායකයා විසින් අවධානය යොමු කළ යුතු කරුු -

පුහුණු වැඩසටහන ආරම්භයේදීම පහත දැක්වෙන කරුණු හුවා දක්වන්න.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ වැඩමුළුවලදී රහස්‍යභාවය සුරැකීම අතිශයෙන්ම වැදගත් වූ කරුණකි. මෙහිදී ප්‍රචණ්ඩත්වයට භාජනය වූ පිරිස සහ ඔවුන්ගේ පවුල්වල රහස්‍යයභාවය රැකීමට කමිටු සාමාජිකයින් පියවර ගත යුතුවේ. දෙපාර්ශවය අතර විශ්වාසය තහවුරු කර ගැනීම සඳහා මෙය අත්‍යාවශ්‍යය කරුණකි. එමෙන්ම කමිටුවේ කාන්තා සාමාජිකයන් ද අපහසුතාවයන්ට මුහුණපෑම වලක්වා ගැනීමට ද වැදගත්ය. උදාහරණයක් ලෙස - කමිටුවේ කාන්තා සාමාජිකාවන් ද විවිධාකාර අපහසුතාවලට ලක් කිරීමට ප්‍රචණ්ඩකාරී පිරිස් විසින් පියවර ගත හැකිය.

- ප්‍රචණ්ඩකාරී තත්වයන් පිළිබඳව සාකච්ඡා කිරීමේදී ඒවා ඉතාමත් රහස්‍යය අයුරින් සිදු කිරීමට පියවර ගත යුතුය. මෙම කරුණු පිළිබඳව අදාල වෘත්තිකයන් සහ පාර්ශවයන් (උදා- පොලිස් නිලධාරීන්, මනෝ චිකිත්සකයන් ආදීන්) සමග පමණක් සාකච්ඡා කළ යුතු අතර වෙනත් බාහිර පාර්ශවයන් සමග සාකච්ඡා කිරීමෙන් වැලකී සිටිය යුතුය.

# 1 වන සැසිය

## 1.1 - සැසිය ඇරඹුම

### පසුබිම සකස් කිරීම

UNWOMEN ආයතනය මගින් සකස් කරන ලද ලංකාවේ දත්ත වාර්තාවන් ඉදිරිපත් කරන්න. ලංකාවේ ඇස්තමේන්තු ගත ස්ත්‍රී ජනගහනය මිලියන 11.283

- ජීවිත කාලය තුළ දී ලිංගික හෝ ශාරීරික ප්‍රචණ්ඩත්වයට ලක්වූ පිරිස 24%කි. මෙමගින් පෙනී යන්නේ ලංකාවේ ස්ත්‍රී ජනගහනයෙන් ආසන්න වශයෙන් හතරෙන් එකක් සිය ජීවිත කාලය තුළදී යම් ආකාරයක ප්‍රචණ්ඩත්වයකට ගොදුරු වන බවයි. සෑම ස්ත්‍රීන් 4 දෙනෙකු ගෙන් එක් අයෙක් ප්‍රචණ්ඩත්වයට ගොදුරු වේ. එම නිසා සාමූහිකයක් ලෙස මේ ප්‍රචණ්ඩත්වය අවම කිරීමට කටයුතු කිරීම වැදගත් වේ.

(දත්ත - UNWOMEN- ශ්‍රී ලංකා දත්ත)

මෙහිදී අවබෝධ කර ගත යුතු වැදගත් කරුණ වන්නේ ඉදිරිපත් කර ඇති දත්ත පදනම් වී ඇත්තේ එසේ ප්‍රචණ්ඩත්වයට ලක්වූ පිරිස විසින් අදාල පාර්ශවයන් දැනුම්වත් කර ඇති අවස්ථාවන් පමණි. එම නිසා සෑබෑ තත්වය මීට වඩා බැරෑරුම් සහ සංකීර්ණ විය හැකිය. බොහෝ කාන්තාවන් සහ ගැහැණු දරුවන් ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ විට ඒ පිළිබඳව අන් පාර්ශවයන් දැනුම්වත් කරන්නේ නැත. තමා යම් ආකාරයක ප්‍රචණ්ඩත්වයකට ගොදුරු වූවා යැයි නොදැනුවත්බව, ඒ සඳහා සහයෝගය ලබා ගන්නා ආකාරය පිළිබඳ අවබෝධයක් නොමැතිකම, සමාජයට ඇති බිය, ප්‍රචණ්ඩකාරී තත්වයන් ඇති කරන පුද්ගලයන් විසින් ඇති කරන බලපෑම්, සහ සංස්කෘතික හේතූන් ප්‍රචණ්ඩත්වයට භාජනය වූ තැනැත්තියක විසින් ඒ පිළිබඳව අන් පාර්ශවයන් දැනුම්වත් කිරීමෙන් වැලකී සිටීමට හේතු විය හැකිය.

එම නිසා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව ඇති කරනු ලබන ප්‍රචණ්ඩත්වය අවම කිරීම වැදගත්වේ. සිය බල ප්‍රදේශයේ ප්‍රජාවගේ සුබ විහරණය වෙනුවෙන් කටයුතු කිරීමේ වගකීම හිමි පළාත් පාලන ආයතනයට එහි දී සැලකිය යුතු වගකීමක් ඇත. මෙම ක්‍රියාවලියේදී පළාත් පාලන ආයතන තුළ ස්ථාපිත කාන්තා උපදේශක කමිටුවට විශේෂ කාර්යභාරයක් සිදු කළ හැකි අතර, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය අවම කිරීමට නිල වශයෙන් වගකිව යුතු ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරීන්, පොලීසියේ කාන්තාවන් පිළිබඳ කටයුතු කරන නිලධාරීන්, පරිවාස නිලධාරීන් සහ බල ප්‍රදේශයේ ප්‍රචණ්ඩත්වය අවම කිරීමට කටයුතු කරන වෙනත් ආයතන සියල්ල කැඳවා දැනට පවතින තත්වය ද, ගත යුතු ක්‍රියාමාර්ග, සහ එම ක්‍රියාවලියේ ප්‍රගතිය වරින් වර විමසීම වැනි කටයුතු මගින් පවතින ප්‍රචණ්ඩත්වය යම් මට්ටමකට හෝ අවම කර ගැනීමට හැකිවනු ඇත.

## සැසියේ අරමුණ

මෙම සැසියේ අරමුණ වන්නේ කාන්තා කමිටු සාමාජිකයන් හා පුහුණුවට සහභාගීවන පිරිසගේ පෞද්ගලික අත්දැකීම් විමසා බැලීමයි.

කාලය - විනාඩි 30

1. සහභාගීවන පිරිසට මෙටා කාඩ්පත බැගින් දී පහත දැක්වෙන අවස්ථාවන්ට මුහුණ දී ඇති දැයි සඳහන් කරන ලෙස ඉල්ලා සිටින්න.

- ඔබ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පුහුණු සැසියන්ට සහභාගීවී තිබේද?
- ඔබ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ක්‍රියාකරන ආකාරය පිළිබඳ පුහුණු වැඩසටහනකට සහභාගීවී තිබේද?
- ඔබ ප්‍රචණ්ඩත්වයට ලක්වූ පිරිස සමඟ වර්තමානයේදී කටයුතු කරමින් සිටිද?
- ඔබ ලිංගික අඩත්තේට්ටම් හෝ දූෂණයකට ලක්වූ අයකු සමඟ සාකච්ඡා කර තිබේද?
- ඔබ එවැනි තත්වයකට ලක්වූ දරුවකු සමඟ සාකච්ඡා කර තිබේද?
- ලිංගික අඩත්තේට්ටම් සහ දූෂණයට ලක්වූ යමෙකු පිළිබඳව ඔබ පෞද්ගලිකව දන්නේද?
- ගෘහස්ත ප්‍රචණ්ඩත්වයට ලක්වූ යමෙකු පිළිබඳව ඔබ පෞද්ගලිකව දන්නේද?
- මෙම ක්‍රියාකාරකම මගින් වැඩමුළුවට සහභාගිවන කාන්තා උපදේශක කමිටු සාමාජිකයින්ගේ දැනුම, අත්දැකීම් පිළිබඳ අදහසක් මෙන්ම මෙම කණ්ඩායම ක්‍රියාත්මකවීමට යෝජිත පරිසරය පිළිබඳව ද යම් අවබෝධයක් ලබා ගැනීමට සම්පත්දායකයාට හැකිවනු ඇත.
- මෙහිදී අදාල බල ප්‍රදේශයේ සමාජ, සංස්කෘතික සහ ආර්ථික පසුබිම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සම්පත්දායකයාට මෙන්ම කමිටු සාමාජිකයන්ට ද වැදගත්වේ.

# 2 වන සැසිය

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව ප්‍රචණ්ඩත්වය පිළිබඳ හැඳින්වීම

මෙම සැසිය මගින් පුහුණු වැඩමුළුවේ පදනම සකස් කරනු ඇත. "ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය" සහ "කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය" යන මූලික සංකල්ප සහ මූලධර්ම පිළිබඳව ක්‍රමානුකූලව අවබෝධ කර ගැනීමට මෙහිදී හැකිවනු ඇත.

### අරමුණු -

1. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව කවර ආකාරයෙන් හෝ සිදුවන ප්‍රචණ්ඩත්වය පිළිබඳව මූලික සංකල්ප සහ ගැටළු පිළිබඳ අවබෝධ කර ගැනීම
2. මෙම මූලික සංකල්ප සහ ගැටළු තේරුම් ගැනීම තුළින් ඒ පිළිබඳව ප්‍රජාව සහ අනෙකුත් පාර්ශවකරුවන් හා සාකච්ඡා කිරීමට ඇති හැකියාව තහවුරු කිරීම.

### ප්‍රධාන වශයෙන් ඉගෙන ගත හැකි කරුණු

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය බොහෝ විට එක් එක් පාර්ශවයක් විසින් ඉටු කළ යුතු යැයි සිතන භූමිකාවන්, අපේක්ෂාවන් සහ සීමාවන් යන කරුණු මත පදනම්වේ. එම නිසා බොහෝවිට මේ ආකාරයේ ප්‍රචණ්ඩත්වයට ස්ත්‍රීන් ලක්වන අතර පුරුෂයන් ද වින්දිතයන් බවට පත්වන අවස්ථා ඇත. එහෙත් ස්ත්‍රීන් බොහෝ අවස්ථාවන්හිදී වින්දිතයන්ට බවට පත්වන්නේ පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන් බලහීන කොටසක් බවට බොහෝ සමාජයන් විසින් පත් කර ඇති හෙයිනි.
- මෙහිදී බලය අනිසි ලෙස භාවිතා කිරීමක් දැකිය හැකිය.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුකරන ප්‍රචණ්ඩත්වයේදී තර්ජනය කිරීම්, බලහත්කාරකම් ආදිය මගින් යම් පීඩනයක් එල්ල කරනු ලබයි. මෙහිදී "ප්‍රචණ්ඩත්වය" යන්නෙන් අදහස් කරනු ලබන්නේ ශාරීරික හිංසනය පමණක්ම නොවේ.එය ඊට වඩා පුළුල් පරාසයක පැතිර ඇත.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය යනු මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනයකි.

## 2.1 සැසිය - ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය - වෙනස හඳුනා ගැනීම

කාලය - විනාඩි 30

මෙහිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ලිංගිකත්වය යන සංකල්ප දෙකේ වෙනස හඳුනා ගැනීමට හැකිවනු ඇත.

### සැසියේ අරමුණ -

1.“Sex”and ”Gender” හෙවත් ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන වචනවල වෙනස අවබෝධ කර ගැනීම

2.සමාජ සහ සංස්කෘතික පසුබිම තුළ ස්ත්‍රීන් සහ පුරුෂයන් ගේ භූමිකාව විමසා බැලීම

## පුහුණු කිරීමේ ප්‍රවේශය

1. ෆ්ලිප් චාට් කඩදාසියක එක් කෙලවරක"sex" (ලිංගිකත්වය) සහ අනෙක් කෙලවර gender (ස්ත්‍රී පුරුෂ සමාජභාවය) යන වචන ලියන්න.
2. සහභාගීවන්නන්ගෙන් මේ වචන දෙකේ වෙනස අසන්න. ඔවුන්ගේ පිලිතුරු එක් එක වචනය යටින් ලියන්න.
3. මෙම සංකල්ප/වචන දෙකේ ඇති වෙනස පැහැදිලි කරන්න.

■ Sex - ලිංගිකත්වය
- ස්ත්‍රීන්ගේ සහ පුරුෂයන්ගේ ජීව විද්‍යාත්මක/භෞතික ශාරීරික වෙනස
- ජීව විද්‍යාත්මකව තීරණය වේ.
- වෙනස් නොවේ (ශල්‍යකර්මයකින් හැර)

■ Gender - ස්ත්‍රී පුරුෂ සමාජභාවය
- සාමාජයීය කරුණු මත පදනම් වේ - ඉතිහාසය, සංස්කෘතිය, සමාජ පිලිවෙත්, ආගම
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු යම් සමාජයක ගැහැණු සහ පිරිමින්(ළමුන් ද ඇතුලත්ව)ගේ සමාජානුයෝජනය මත පදනම් වේ. එක් එක් අයගේ භූමිකාව, වගකීම්, අවස්ථා, සීමාවන් සහ අපේක්ෂාවන් මත එය පදනම් වේ.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ නිර්වචනය වෙනස්විය හැකිය.

## පහත දැක්වෙන කරුණු පැහැදිලි කරන්න

ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු යහපත් හෝ අයහපත් තත්වයක් නිර්වචනය කිරීමට භාවිතා කරන වචනයක් නොවේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හෝ Gender යන වචනය බොහෝවිට කාන්තාවන් පිළිබඳව හෝ ස්ත්‍රීවාදී අදහස් පිළිබඳව කතා කිරීමට ද කාන්තාවන් සඳහා සීමාවූ වැඩසටහන් හැඳින්වීමට ද බොහෝ අය පෙළඹී ඇත. එමෙන්ම මෙම වචනය භාවිතා කිරීමේදී පුරුෂයන් ඇතුලත් නොකිරීමට හෝ ඔවුන් කෙරෙහි වෛරී ස්වභාවයක් ඇති කිරීම වැනි ඍණාත්මක තත්වයන් ඇති කිරීමට යම් පාර්ශවයන් පෙළඹී ඇත. එහෙත් Gender හෙවත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු ස්ත්‍රීන් සහ පුරුෂයන් යන දෙපාර්ශවයම ඇතුළත් වන ඔවුන්ගේ භූමිකාව නිර්වචනය කරන්නක් බව අවබෝධ කර ගත යුතුය.

4. ෆ්ලිප් චාට් කඩදාසියක සමාජ/සංස්කෘතික අපේක්ෂාවන් යන වචනය මාතෘකාව ලෙස ලියා එය තීරු දෙකකට බෙදන්න - එක පැත්තක පුරුෂයන්/පිරිම් දරුවන් යන්නද අනෙක් පැත්තේ ස්ත්‍රීන් සහ ගැහැණු දරුවන් ලෙස ලියන්න.
5. සහභාගීවන්නන්ගෙන් ප්‍රතිචාර ලබා ගනිමින් මේ එක් එක් පාර්ශවයට අදාල සමාජ/සංස්කෘතික අපේක්ෂාවන් ලියන්න.
6. මෙලෙස සඳහන් කළ එක් එක් කරුණ ජීව විද්‍යාත්මකව පදනම්වූවක් හෝ එක් එක් පාර්ශවයේ භූමිකාව මත පදනම්වූවක්දැයි විමසා බලන්න. උදා - දරුවන් ලැබීම ජීව විද්‍යාත්මක වන අතර ඉවුම් පිහුම් කටයුතු කිරීම සාමාජයීය අපේක්ෂාවන් මත පදනම් වූ කරුණකි.
7. මේ අනුව ජීව විද්‍යාත්මකව හා සමාජ/සංස්කෘතික භූමිකාවන් මත පදනම් වූ කරුණු මත ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන කරුණු වෙනස්වන බව සහභාගීවන්නන්ට තහවුරු කරන්න.

පහත දැක්වෙන කරුණු ලිංගිකත්වය මත හෝ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය මත පදනම්ව ඇතිදැයි විමසන්න.

- ස්ත්‍රීන් දරුවන් වදන අතර පුරුෂයන් එසේ නොකරයි (ලිංගිකත්වය S)
- කුඩා ගැහැණු දරුවන්ට මෘදු ගතිපැවැතුම් ඇති අතර පිරිමි දරුවන් දරදඬු
- ස්වභාවයකින් හැසිරෙයි. (ස්ත්‍රී පුරුෂ සමාජභාවය G)
- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වැඩි වශයෙන් රැකියාව කරන්නේ පිරිමින්ය (G
- බස් රියදුරු රැකියාව කරන්නේ පිරිමින්ය (G)
- කාන්තාවන් දරුවන් රැකබලා ගත යුතුය (G)
- එක්සත් ජාතීන්ගේ දත්තයන්ට අනුව ලෝකයේ 67% පමණ කාන්තාවන් ආදායම් උත්පාදනයේ නියැලෙන නමුත් සමස්ත ලෝක ආදායමෙන් ඔවුන් උපයන්නේ 10% පමණි.(G)

සටහන

මෙම පුහුණු මොඩියුලයේ ඉදිරි සැසි සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය Gender සහ ලිංගිකත්වයේ Sex යන වචන දෙකේ වෙනස පිළිබඳ මනා අවබෝධය වැදගත් වේ.

## 2.2 සැසිය- බලය, බලහත්කාරකම සහ කැමැත්ත

කාලය - විනාඩි 45

මෙම සැසිය මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට අදාල ප්‍රධාන සංකල්ප තුනක් පිළිබඳව සාකච්ඡා කරනු ඇත. මෙම සංකල්ප තුන එකිනෙක හා සම්බන්ධ වුවද මෙහිදී එය වෙන් වශයෙන් පියවරෙන් පියවර සාකච්ඡා කිරීම මගින් සහභාගීවන්නන්ට පහසුවෙන් අවබෝධ කර ගැනීමට හැකිවේ.සංකල්ප පිළිබඳ අවබෝධය තහවුරු කර ගැනීම පිණිස උදාහරණ දෙකක් ගෙන කණ්ඩායම් සාකච්ඡාවක් පැවැත්වීමට නිර්දේශ කරනු ලැබේ.

### සැසියේ අරමුණ -

1. බලය අනිසි ලෙස යෙදවීම සහ ප්‍රචණ්ඩත්වය අතර ඇති සබැඳියාව.
2. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේදී බලය යෙදීම මගින් ප්‍රචණ්ඩත්වයක් සිදු කිරීම යනු කුමක්ද? මෙය ශාරීරික හිංසනය පමණක්ම නොවන බව අවබෝධ කර ගැනීම.
3. දැණුවත්භාවය මත කැමැත්ත ප්‍රකාශ කිරීම "informed consent" යන සංකල්පය අවබෝධ කර ගැනීම සහ එය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය අතර ඇති සම්බන්ධතාවය.

### බලය ( විනාඩි 5)

1. ෆ්ලිප් චාර්ට් කඩදාසියක් මත බලය යන වචනය ලියන්න
2. යමෙකුට බලය ලැබෙන්නේ කවර ආකාරයෙන්ද? යන්න සහභාගීවන්නන්ගෙන් විමසා ෆ්ලිප් චාට් කඩදාසිය මත ලියන්න.
3. විවිධ ආකාරයෙන් බලය යෙදීම පිළිබඳව සාකච්ඡා කරන්න - උදා තමන් නියෝජනය කරන සමාජයේ පුද්ගලයන් බලය විවිධාකාරයෙන් භාවිතා කරන ආකාරය සාකච්ඡා කරන්න. මෙහිදී පුද්ගලයන්ගේ නම් සඳහන් කිරීමෙන් වළකින ලෙස ඉල්ලා සිටින්න.
4. ප්‍රචණ්ඩත්වය යනු බලය අනිසි ලෙස භාවිතා කිරීමයි යන්න පැහැදිලි කරන්න. මෙහිදී ප්‍රචණ්ඩත්වයට භාජනය වන තැනැන්තා හෝ තැනැත්තිය යමෙකුට ඒ සඳහා සැබෑ බලයක් ඇතැයි සිතා සිටීමෙන් වින්දිතයකු බවට පත්වීම.
5. මෙම ෆ්ලිප් චාට් කඩදාසියේ සඳහන් කරුණු පිළිබඳව පසුව විමසා බැලීම පිණිස ආසන්න ස්ථානයක අලවා තබන්න.

## බලය යෙදීම - (විනාඩි 5-10)

1. ෆ්ලිප් චාට් කඩදාසියක ප්‍රචණ්ඩත්වය යන වචනය ලියන්න.
2. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සාකච්ඡා කිරීමේදී ප්‍රචණ්ඩත්වය යනුවෙන් අදහස් කරන්නේ කවරක්ද යන්න පිළිබඳව වචනයකින් හෝ වචන කිපයකින් කඩදාසියේ සටහන් කරන ලෙස සහභාගීවන්නන්ගෙන් ඉල්ලා සිටින්න.
3. සහභාගීවන්නන් විසින් ලියන ලද කරුණුවලින් එකක් සඳහන් කරන ලෙස ඉල්ලන්න. එය ෆ්ලිප් චාට් කඩදාසියේ සඳහන් කරන්න. සහභාගීවන සියලු දෙනාගේ අදහස් ලියන්න.

### සටහන

- මෙය ඉතා කඩිනමින් කළ යුතු අතර යමෙක් මීට පෙර පැවැසූ කරුණක් නැවත කීමෙන් වලකින ලෙස ඉල්ලා සිටින්න.
- මෙහිදී සමහර අය ප්‍රචණ්ඩත්වයට උදාහරණ දෙන අතර සමහරෙක් එය නිර්වචනය කරනු ඇත. සියලු අදහස් සටහන් කරන්න.

4. කෙටි සංවාදයක යෙදෙන්න. මෙහිදී සහභාගීවන්නන් එකඟ නොවන කරුණු කපා හරින්න.

5. ෆ්ලිප් චාට් කඩදාසියේ ඉහලින් බලය යෙදීම හා ප්‍රචණ්ඩත්වය යන වචන ලියන්න.

## ප්‍රචණ්ඩත්වය/බලය යෙදීම

මෙම සාකච්ඡාව අවසානයේ ප්‍රචණ්ඩත්වය යනු යම් ආකාරයක සැබෑ බලයක් හෝ තමන්ට ඇති ය විස්වාස කරන බලයක් යෙදීමෙන් සිදු කරන හිංසාකාරී ක්‍රියාවක් බව පැහැදිලි කර දෙන්න.

## දැනුවත්භාවය මත පදනම්වූ කැමැත්ත (විනාඩි 5)

හිස් ෆ්ලිප් චාට් කඩදාසියක "කැමැත්ත" යන වචනය ලියන්න.

1. කැමැත්ත යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි සහභාගීවන පිරිසෙන් විමසන්න. ඔවුන්ගේ ප්‍රතිචාර ෆ්ලිප් චාට් කඩදාසියේ ලියන්න. මෙහිදී දැනුවත්භාවය මත පදනම් වූ කැමැත්ත සහ එසේ නොමැතිව කැමැත්ත ලෙස ප්‍රතිචාර දැක්වීමේ වෙනස ඉස්මතු කරන්න - එනම් දැනුවත්ව හා ස්වේච්ඡාවෙන් වන කැමැත්ත කුමක්දැයි සහභාගීවන්නන්ට අවබෝධ විය යුතුය.

2. මෙම සැසිය අදාල ෆ්ලිප් චාට් කඩදාසි මත ලියූ කරුණු සාරාංශ ගත කරන්න. බලය, ප්‍රචණ්ඩත්වය/සහ බලය යෙදීම, කැමැත්ත/අභිප්‍රාය.

## ක්‍රියාකාරකම (විනාඩි 20)

පහත දැක්වෙන උදාහරණ කියවන්න. එක් එක් ප්‍රශ්ණය පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඊළඟ ගැටළුවට යන්න.

01. ඉතාමත් සම්ප්‍රදායික පීතෘ මූලික පවුලක, පියා විසින් වයස අවුරුදු 19 වන සිය දියණියට විවාහයක් සූදානම් කර ඇති බව කියයි. එම දියණිය විවාහයට යෝජිත පුරුෂයා පිළිබඳව නොදන්නා අතර ඔහු ඇයට වඩා තරමක් වයසින් වැඩිමහල්ය. එහෙත් ඔහු හා විවාහවීමට දියණිය එකඟ වෙයි.

- වර්තමානයේ මෙවැනි තත්වයක් ඇතිවිය හැකි යැයි ඔබ සිතනවාද?
- ඇය කැමැත්ත ප්‍රකාශ කළේ දැනුවත්භාවයකින් යුක්තවද?
- මෙහිදී යම් බලයක් යෙදවුයේද?
- මෙහිදී වඩාත් බලසම්පන්න පාර්ශවය වන්නේ පියාද? දුවද?
- පියා සතු බලය කුමක්ද?
- දියණිය සතු බලය කුමක්ද?
- මෙහිදී තෝරා ගැනීම් සලකා බැලුවහොත් ඒ සඳහා වූ බලය ඇත්තේ කවුරු සතුවද?

02. ගම්බද ප්‍රදේශයක වාසය කරන දරිද්‍රතාවයෙන් පෙලෙන කාන්තාවකට ඉගෙනුමට දක්ෂ සිය පුතා නගරයේ වඩාත් හොඳ පාසැලකට ඇතුලත් කර ගැනීමට අවශ්‍යතාවක් ඇත. ඇයගේ සැමියා දරුවාගේ අධ්‍යාපනය පිළිබඳව උනන්දුවක් නැත. එම පාසැලේ විදුහල්පතිතුමා සමඟ සමීප සබඳතාවක් ඇති යැයි කියා ගන්නා පුද්ගලයෙකු විදුහල්පතිතුමා හමුවීමට මෙම මව රැගෙන යන බවට පොරොන්දු වී ඇත. කෙසේ වෙතත් ඒ සඳහා ප්‍රථමයෙන් අල්ලසක් දිය යුතු බව එම පුද්ගලයා පවසා ඇති අතර දරුවාගේ මව සතුව එතරම් මුදලක් නැති බව ඇය පවසා ඇත. එහෙත් තමා සමඟ ලිංගික සබඳතාවක් පැවැත්වුවහොත් ඇයව විදුහල්පතිතුමා හමුවීමට රැගෙන යා හැකියැයි එම පුද්ගලයා පවසා ඇත. මෙම කාන්තාව එයට එකඟ වී ඇත.

- මෙවැනි අවස්ථාවන් ඇති විය හැකි යැයි ඔබ විශ්වාස කරන්නේද?
- ඇය දැනුවත්භාවයෙන් මේ සඳහා සිය කැමැත්ත ප්‍රකාශ කළාද? (නැත. මෙය දූෂණයකි)
- මෙම ක්‍රියාවලියේදී යම් බලයක් පාවිච්චි කළේද?
- මෙහිදී වඩාත්ම බලවත් වන්නේ අතරමැදි පුද්ගලයාද, දරුවාගේ මවද?
- මෙම අතරමැදි පුද්ගලයා කිනම් ආකාරයේ බලයක් හිමිද?
- දරුවාගේ මවට කිනම් ආකාරයේ බලයක් හිමිද?
- මෙම උදාහරණයේදී බලය සහ තෝරා ගැනීම/තීරණ ගැනීම එකිනෙකට සම්බන්ධ වන්නේ කෙසේද?

## සාකච්ඡා කළ යුතු ප්‍රධාන කරුණු -

### බලය:

චූදියන්ට සැබෑ ලෙස හෝ ආරෝපණය කර ගත් බලයක් හිමිය. ඒ සඳහා පහත දැක්වෙන උදාහරණ විමසා බලන්න.

- **සමාජ** - සම කණ්ඩායම්වල බලපෑම්, හිරිහැර, ගුරුවරු, තමන්ට වඩා ඉහල නායකයන්, දෙමව්පියන්.
- **ආර්ථික** - මුදල්, භාණ්ඩ, සේවාවන්, උදව් ලබා ගැනීම වැනි කරුණු වලදී චූදිතයන්ට වැඩි බලයක් හිමිව තිබීම. උදා - පියා හෝ ස්වාමිපුරුෂයා.
- **දේශපාලන** - මහජන නියෝජිතයන්, දේශපාලන පක්ෂවල සංවිධායකවරු ආදීන්.
- **භෞතික** - ශාරීරික ශක්තිය හා ප්‍රමාණය, අසැබි වචන භාවිතය.
- **ස්ත්‍රී පුරුෂ සමාජභාවය** - කාන්තාවන්ට වඩා බලවත් තත්වයක් යම් සමාජයක පුරුෂයන්ට හිමිවීම.
- **වයස** - සාමාන්‍යයෙන් වයසින් අඩු හෝ වැඩි පිරිසට බලය අඩුය.

තෝරා ගැනීම් සඳහා බලය සෘජුව සම්බන්ධ වෙයි. බලවත් පුද්ගලයන්ට තෝරා ගැනීම් රාශියක් ඇති අතර දුබල පුද්ගලයන්ට එවැනි අවකාශයක් නැත. සවිබල රහිත පුද්ගලයන්ට ඇති තෝරා ගැනීම් සීමිත වන අතර ඔවුන් අපයෝජනයට ලක්වීමට ඇති අවකාශය වැඩිය.

1. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය බලය අපයෝජනය කිරීමකි. දෙපාර්ශවයක ඇති අසමතුලිත බලය, වැඩි බලයක් ඇති පාර්ශවය විසින් බල රහිත පාර්ශවය අපයෝජනය හෝ ප්‍රචණ්ඩත්වය ලක් කිරීම සඳහා යොදා ගනීම.

2. ඔබට හැගෙන පරිදි වැඩි බලයක් ඇති සියලු පිරිස් එම බලය අපයෝජනය සඳහා යොදා ගනීද? (නැත)

### ප්‍රචන්ඩත්වය - බලය යොදා ගැනීම:

"බලය යෙදීම යනු" ශාරීරික, මානසික, සමාජීය හෝ ආර්ථික වශයෙන් කළ හැකි බලපෑම් ලෙස හැඳින්විය හැකිය. එය යම් බලපෑමක් හෝ පීඩනයක් යෙදීම ලෙස සැලකිය හැකිය. බලය යෙදීම යනු බලපෑම් කිරීම, අඩත්තේට්ටම් කිරීම, පීඩාවට පත් කිරීම ආදී වශයෙන් වූ මානසික හෝ සමාජීය බලපෑම් ආදිය ද හැඳින්විය හැකිය.මෙවැනි ප්‍රචන්ඩකාරී තත්වයන්ට පත්වන්නන් චූදියන් විසින් අපේක්ෂා කරන ලෙස හැසිරීමට හෝ යම් අපේක්ෂිත කාරණයක් ඉටු කිරීමට පෙළඹෙන අතර එය චූදිතයන් කෙරෙහි ඇති බියට හෝ ඔවුන් විසින් සැබැවින්ම සිදු කරනු ඇතැයි යැයි සිතන යම් හානිකර ක්‍රියාවකට ප්‍රතිචාර ලෙස කරන දෙයක් ලෙස සැලකිය හැකිය.

- ප්‍රචණ්ඩත්වය යනු ශාරීරික වශයෙන් වූ පීඩාකාරී හිරිහැර සිදු කිරීම, හෝ යම් බලපෑම් හෝ, අඩත්තේට්ටම් ආදිය සිදු කිරීමක් ලෙස සැලකිය හැකි අතර අගතියට පත් හෝ දුර්වල පාර්ශවයකින් යම් ප්‍රතිලාභයක් ලබා ගැනීමට හෝ එවැනි ප්‍රතිලාභයක් ලබාදීමට වූ පොරොන්දුවක් මත සිදු කරන ක්‍රියාවක් ද විය හැකිය.

- ප්‍රචණ්ඩත්වය යනු යමෙකුගේ අභිරුචියක් හෝ කැමැත්තක් නොමැතිව යම් බලපෑමක්/ පීඩනයක් යෙදීමය.

## කැමැත්ත/අභිරුචිය:

කැමැත්ත හෝ අභිරුචිය යනු යමක් කිරීමට එකඟතාව දැක්වීමයි. දැනුවත්භාවයෙන් කැමැත්ත ප්‍රකාශ කිරීම යනු යම් තැනැත්තකු විසින් නිදහසේ හා ස්වේච්ඡාවෙන්ම එකඟතාවය දැක්වීම සහ සමාන බලයක් ඇති දෙපාර්ශවයක් එකඟතාවයට පත්වීමයි.

- කැමැත්ත/අභිරුචිය - නිදහසේ එකඟවූ, දැනුවත්භාවයකින් යුක්ත වූ, ව්‍යාකූලතාවයකින් තොර වූ සහ යම් හැසිරවීමකින් තොර වූ  කැමැත්තක් ලෙස අර්ථ නිරූපනය කළ හැකිය. විශේෂයෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයක් සිදුවී තිබේදැයි සලකා බැලීමේදී යම් තීරණයක් නිදහසේ ගත් තීරණයක්  විය යුතුයි. ඉන් අදහස් කරන ලද්දේ, බලපෑමකින් හෝ, පීඩනයකින් තොරවූ තීරණයකි.
- දැනුවත්භාවය - ක්‍රියාවලියේ සන්දර්භය පිළිබඳ ප්‍රමාණවත් අවබෝධය
- තීරණය වෙනස් කිරීමට ඇති හැකියාව - තමන්ගේ තීරණය ස්වාධීනව වෙනස් කිරීමට හැකිවීම.
- නිශ්චිත වීම - එකඟතාව දැක්වූ කරුණ නිශ්චිත වීම සහ එය වෙනත් ක්‍රියාවලියකට හෝ තීරණයකට අදාල නොවීම හෝ බලපෑමක් නොකිරීම.
- හැකියාව - අදාල තැනැත්තාට එම තීරණය ගැනීමට හැකියාව තිබීම (උදා- බලපෑමකින් තොරවූ තැනැත්තකු, අඩු වයස් හෝ මානසික ව්‍යාකූල තත්වයක නොමැති වීම).
- නෛතික හා මානව හිමිකම්වලට අදාලව විමසා බැලීම.
- කැමැත්ත ස්ථිර ලෙස දැක්වීම - නිහඬව සිටීම, අකමැත්තක් නොපෙන්වීම හෝ පෙර අත්දැකීම් මත තීරණ ගැනීම මෙහිදී ස්ථිර කැමැත්ත ලෙස හුවා දැක්විය නොහැක.

- බලයේ සමතුලිතභාවය - උදා ගුරුවරයකු හා ශිෂ්‍යකු හෝ සේව්‍යයා සහ සේවකයා අතර ඇත්තේ අසමතුලිත බලයකි.
- කම්පනයන් මත පදනම් වූ ප්‍රවේශය - මෙය අතිශයින් වැදගත් කරුණකි. සමහර අවස්ථාවන්හිදී වින්දිතයන් යම් කම්පනයක් හේතුවෙන් කැමැත්ත හෝ එකඟතාවයක් දැක්විය හැකිය. මෙය නිදහස් ලෙස ගත් තීරණයක් ලෙස සැලකිය නොහැක.
- බාල වයස් කාණ්ඩවලට අයත් පිරිස (වයස 18 අඩු) දැනුවත්භාවයක් මත පිහිටා කැමැත්ත දුන්නද එය නීතිය ඉදිරියේ වලංගු නැත.

## 2.3 සැසිය - මානව හිමිකම්

### කාලය - විනාඩි 30

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය මානව හිමිකම් උල්ලංඝනය කිරීමකි. මෙම සැසිය මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය මානව හිමිකම් උල්ලංඝනයක් වන ආකාරය පිළිබඳව විමසා බැලීමට අපේක්ෂා කරයි.

### සැසියේ අරමුණ -

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය හා මානව හිමිකම් අතර ඇති සම්බන්ධය අවබෝධ කර ගැනීම

### ක්‍රමවේදය -

1. මානව හිමිකම් යනුවෙන් දැක්වෙන ස්ලයිඩ් එකක් පෙන්වා, සහභාගීවන්නන්ගෙන් එහි තේරුම විමසන්න. සියළුදෙනාම මානව හිමිකම් සඳහා අයිතිවාසිකම් ඇති බව සාකච්ඡා කරන්න.
2. ඔබට මානව හිමිකම් ලබාදෙන්නේ කව්රුන් විසින්දැයි විමසන්න. තමන්ගේ මානව හිමිකම් උපතින්ම හිමිවන අයිතිවාසිකමක් මිස අන් පාර්ශවයකින් ආරෝපණය කරන අයිතිවාසිකමක් නොවන බව පැහැදිලි කරන්න.
3. මානව හිමිකම් පිලිබඳ උදාහරණ කීපයක් සාකච්ඡා කරන්න.

### සාකච්ඡා කළ යුතු ප්‍රධාන කරුණු -

- මානව හිමිකම් යනු විශ්වීය, වෙන් කළ නොහැකි, බෙදිය නොහැකි සහ එකිනෙක හා සහසම්බන්ධයක් ඇති අයිතිවාසිකම්ය.
- සියළු මනුෂ්‍යයන්ට තමන්ගේ හමේ වර්ණය, භාෂාව, ආගම, දේශපාලන ලැදියාව, සමාජයීය තත්වයන්, දේපල, හෝ වෙනත් යම් කරුණු මත පදනම් නොවී මානව හිමිකම් සඳහා අයිතිවාසිකම් හිමිවී තිබේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැලැක්වීම හෝ එයට නිසි ලෙස ප්‍රතිචාර දැක්වීම මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ඍජුව සම්බන්ධ වේ.

එවැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් ජාත්‍යන්තර මානව හිමිකම් කීපයක් උල්ලංඝනය කරනු ඇත.

- ජීවිතයට හා ආරක්ෂාවට ඇති හිමිකම
- ඉහල මානසික හා ශාරීරික මට්ටමකින් ජීවත්වීමට ඇති හිමිකම
- කෲර, හා අමානුෂික වදහිංසාවලින් තොරව ජීවත්වීමේ අයිතිය
- නිදහස් අදහස් හා මතවාද ප්‍රකාශ කිරීමට ඇති අයිතිය, අධ්‍යාපනයට හා සමාජ ආරක්ෂාවට මෙන්ම පෞද්ගලික අභිවෘද්ධිය සඳහා ඇති අයිතිය

## 2.4 සැසිය - වින්දිතයන් හා චූදිතයන්

කාලය - විනාඩි 15

ඕනෑම ප්‍රචණ්ඩ ක්‍රියාවලියක අවම වශයෙන් දෙපාර්ශවයක් හෝ මැදිහත්වේ; එනම් එම ක්‍රියාව සිදු කරන තැනැත්තා චූදිතයා සහ එයට භාජනය වන තැනැත්තා වින්දිතයායි. මෙම සැසියේදී එම වින්දිතයා සහ චූදිතයා හඳුනා ගන්නා ආකාරය සාකච්ඡා කරනු ඇත.

සැසියේ අරමුණ -

1. මෙම දෙපාර්ශවයම පැහැදිලිව වෙන් වශයෙන් හඳුනා ගැනීම.
2. වින්දිතයා හෝ ප්‍රචණ්ඩත්වයෙන් අත්මිදුන තැනැත්තා යන චරිත ස්වභාවයන් හඳුනා ගැනීම.

ක්‍රමවේදය -

1. ෆිලිප් චාට් කඩදාසියක වින්දිතයා VICTIM හා ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු තැනැත්තා SURVIVOR යන වචන ලියන්න.

2. මෙම වචන දෙකේ ඇති වෙනස කුමක්දැයි විමසන්න.
   - වින්දිතයා සහ ඉන් බේරුණු තැනැත්තා යන වචන ඇසූ විට සහභාගීවන්නන්ට හැඟෙන දේ විමසන්න.
   - වින්දිතයා සහ ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු තැනැත්තා ගේ වෙනස හඳුනා ගත හැකිද?
   - වඩාත් අවදානම් තත්වයට පත්වී ඇත්තේ වින්දිතයාද ඉන් බේරුණු තැනැත්තාද?

3. ෆිලිප් චාට් කඩදාසියක චූදිතයා යන වචනය ලියන්න.
4. චූදිතයා යන්නෙන් අදහස් කරන්නේ ප්‍රචණ්ඩත්වය සිදු කරන තැනැත්තායි. මෙහිදී එක් පුද්ගලයෙක් හෝ පුද්ගලයන් කීපදෙනෙකුට මෙවැනි තත්වයක් ඇති කළ හැකිය.
5. චූදිතයන් බවට පත්විය හැකි පුද්ගලයින් 10 දෙනෙකු පමණ සඳහන් කරන ලෙස සහභාගීවන්නන් ගෙන් ඉල්ලා සිටින්න. මෙහිදී නම් සඳහන් කිරීමෙන් වැලකී ඔවුන් ගේ ස්වභාවය පමණක් සඳහන් කිරීම ප්‍රමාණවත්ය. මෙහිදී එක් එක් ප්‍රදේශයෙන් ප්‍රදේශයට මෙය වෙනස් වන බව ද නිරීක්ෂණය කළ හැකිය.
   උදාහරණ - නාගරික ප්‍රදේශ/ග්‍රාමීය ප්‍රදේශ.
6. ඕනෑම ප්‍රචණ්ඩ ක්‍රියාවකදී අවම වශයෙන් එක් චූදිතයකු හා එක් වින්දිතයකු සිටිය හැකි බවත් අපගේ අවධානය යොමු විය යුත්තේ පුද්ගලයන් මෙම තත්වයට පත්වීම වලක්වාගැනීම හෝ අවම කර ගැනීමයි. එමෙන්ම චූදිතයන්ට ප්‍රතිචාර දක්වන ආකාරය ද මෙහිදී අප සතු වගකීමකි.

## සාකච්ඡා කළ යුතු කරුණු -

- වින්දිතයා යන වචනයට වඩා ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු තැනැත්තා යන්නෙන් හැඳින්වීම වඩාත් යෝග්‍යය වනු ඇත.
- මෙහිදී වින්දිතයකු ගේ ස්වභාවය සහ ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු කෙනෙකුගේ ස්වභාවය පිළිබඳව ඔහු/ඇයගේ හැසිරීම් ස්වභාවය මත පෙන්වා දිය හැකිය. සහභාගීවන තැනැත්තන්ට එවැනි චරිතයක් රඟ දක්වන ලෙස ඉල්ලා සිටින්න. එවිට මෙවැනි තත්වයන්ට භාජනය වුණු තැනැත්තන් පහසුවෙන් හඳුනා ගැනීමට සහභාගීවන්නන්ට හැකිවනු ඇත.

උදාහරණ - වින්දිතයකු ගේ ස්වභාවය වන්නේ දුර්වල, ශරීරය හකුලාගත්, කුඩු ගැසුනු, හැඬුම්බර, පිළිවෙලකට ඇඳුමක් නැති, ව්‍යාකූල මානසිකත්වයකින් යුත් තැනැත්තෙකි.

- ප්‍රචණ්ඩත්වයෙන් බේරුණු කෙනෙකුගේ "survivor" ස්වභාවය - ඍජුව සිටගත්, ඍජුව බලන, විශ්වාසයෙන් යුතුව ඇවිදින, නිරවුල් මානසික ස්වභාවයක් ඇති තැනැත්තෙකි. ඔහු/ඇය තුළින් බලවත් සහ ලෝකය සවිබල ගැන්වීමට හැකි පෞර්ෂත්වයක් දිස්වේ.

- ප්‍රචණ්ඩත්වයන් බේරුණු/වින්දිතයා යන චරිත දෙකට පහත දැක්වෙන පිරිස ඇතුලත් විය හැකිය.
  - දරුවන්, විශේෂයෙන්ම අනාත වූ දරුවන් සහ අන් අයගේ රැකවල් යටතේ ජීවත්වන දරුවන්
  - කාන්තාවන් විශේෂයෙන්ම සමහර සංස්කෘතීන් තුළ ඔවුන් දුබල සහ දෙවන පන්තියට අයත් කොටසක් ලෙස සැලකේ.
  - පුරුෂයන්ගේ නිසි ආරක්ෂාවක් නොමැති කාන්තාවන්
  - තනිවූ කාන්තාවන්/මාතෘ මූලික පවුල්
  - මානසික සහ/හෝ ශාරීරික දුබලතා ඇති කාන්තාවන් සහ පුරුෂයන්
  - ආර්ථික අපහසුතා ඇති පුද්ගලයන්
  - ස්ත්‍රී සහ පුරුෂ කනිෂ්ඨ සේවකයන්, ශිෂ්‍යයන්, ආන්තික සමාජ කොටස්
  - ආගමික, ජාතින්, සහ වෙනත් ලිංගික අනන්‍යතා ඇති සුළු කණ්ඩායම්
  - සරණාගත සහ අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයන්

- චුදිතයන් ලෙස සලකන්නේ යම් පුද්ගයෙක් හෝ පුද්ගල කණ්ඩායමක් විසින් අන් පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් වෙත දක්වන ප්‍රචණ්ඩකාරී හැසිරීමයි. එවැනි ස්වභාවයක් ඇති පුද්ගලයින් ලෙස හඳුනාගත හැකිවන්නේ
  - යම් බලයක් ඇති හෝ බලයක් ඇතැයි සිතා සිටින තැනැත්තන්
  - තීරණ ගැනීමේ හැකියාව ඇති නිලතල දරන පිරිස්
  - අධිකාරී බලයක් ඇති පිරිස්

- චුදිතයන් බවට පත්විය හැකි පිරිස පහත කණ්ඩායම්වලට අයත්විය හැකිය.
  - සමීප සහකරුවන් (ස්වාමිපුරුෂයන්, ප්‍රේමවන්තයන්)
  - යම් බලපෑමක් කළ හැකි සමාජ කණ්ඩායම් (ගුරුවරු, නායකයින්, දේශපාලනඥයින්)
  - ආරක්ෂක අංශයේ පිරිස්
  - ආගන්තුකයින්
  - ප්‍රජාවේ සාමාජිකයින්
  - ඥාතීන් (සහෝදරයින්, මාමා, නැන්දා, දෙමව්පියන්, සහෝදරියන් ආදීන්)

- බලය සහිත පුද්ගලයන්
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ඕනෑම ප්‍රචණ්ඩ ක්‍රියාවකදී වින්දිතයකු හා චූදිතයකු යන දෙපාර්ශවය සිටියි.එම නිසා එවැනි ප්‍රචණ්ඩත්වයෙන් වැලැක්වීමට හා අවම කිරීමට කටයුතු කිරීමේ දී මෙම දෙපාර්ශවය කෙරෙහිම අවධානය යොමු කිරීම වැදගත් වේ.

## සැසිය 2.5 - ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය නිර්වචනය කිරීම.

කාලය - විනාඩි 30.

මෙම සැසිය තුළ වැඩමුළුවේ කරුණු සමාලෝචනය කරන අතර සහභාගීවන්නන්ට ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳව පැහැදිලි නිර්වචනයක් ලබා දෙනු ඇත.

ක්‍රමවේදය -

1. පෙර සැසිවලදී ආවරණය කරන ලද සංකල්ප පිළිබඳව සිහිපත් කරන්න. එම සංකල්ප ෆිලිප් චාට් කඩදාසියක ලියන්න. තවත් කරුණු පසුව ලිවීම සඳහා වචන අතර ඉඩ තබන්න.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය

බලය

ප්‍රචණ්ඩත්වය/පීඩනය යෙදීම

දැනුම මත එකඟවීම/කැමැත්ත ප්‍රකාශ කිරීම

මානව හිමිකම්

1. මෙම වචන/සංකල්ප මත සැලකිලිමත් වෙමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය යන වචනයේ තේරුම ලියන්න. ඒ පිළිබඳව සාකච්ඡා කරමින් ෆිලිප් චාට් කඩදාසියේ පහත දැක්වෙන ප්‍රධාන සංකල්ප ලියන්න
2. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ නිර්වචනය UNHCR මගින් 2003 වසරේ නිකුත් කරන ලද ලිංගික ප්‍රචණ්ඩත්වය (SGBV) වලකා ගැනීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා වූ උපදේශන මාලාවේ සඳහන් කර ඇත.

### සාකච්ඡා කළ යුතු ප්‍රධාන කරුණු -

- මෙම සංකල්ප එක් කරමින් සාකච්ඡා කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ නිර්වචන ගොඩනගා ගත හැකිය. එනම් සමාජ භූමිකාවන්, අපේක්ෂාවන්, සීමාවන්, ආදී කරුණු මෙහිදී පාදක විය හැකිය. මෙහිදී කාන්තාවන් වැඩි වශයෙන් ප්‍රචණ්ඩත්වයට භාජනය වන බව නිරීක්ෂණය කර ඇත. පුරුෂයන්ද යම් අවස්ථාවන්හිදී එවැනි තත්වයන්ට මුහුණ දෙන නමුත් අඩු සච්බල මට්ටමකින් යුත් කාන්තාවන් හිංසනයට ලක්වීමේ වැඩි ප්‍රවණතාවයක් ඇති බව නිරීක්ෂණය කළ හැකිය.

බලය - ප්‍රචණ්ඩත්වය යනු බලය අයුතු ලෙස පාවිච්චි කිරීමයි.

ප්‍රචණ්ඩත්වය/ බලය යෙදීම - ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය බලය හා පීඩනය අයුතු ආකාරයෙන් යෙදීමෙන් විවිධ ආකාරයෙන් සිදු කරන බව සමාජයේ දැකිය හැකිය. බලය/පීඩනය යෙදවීම යනු සෑම අවස්ථාවකදීම ශාරීරික පීඩාවන්ට පත් කිරීම පමණක් නොව එය එම තත්වයන් ඉක්මවා යන්නකි.

දැනුවත්භාවය මත කැමැත්ත ප්‍රකාශ කිරීම - ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන්හිදී කැමැත්ත ප්‍රකාශ කිරීම ප්‍රමාණවත් තොරතුරු මත පදනම්ව සිදු කළ නොමැති අවස්ථාවක වුව ද විය හැකිය.

මානව හිමිකම් උල්ලංඝනය කිරීම - ප්‍රචණ්ඩත්වය යනු මූලික මානව හිමිකම් උල්ලංඝනය කිරීමකි.

බලය අයුතු ලෙස පාවිච්චි කිරීම මගින් සිදු කරන යම් ක්‍රියාවක් හේතුවෙන් යම් තැනැත්තකු ශාරීරික, ලිංගික හෝ මානසික වදහිංසනයකට ලක් කිරීම සිදුවන්නේ ඇය කාන්තාවක හෝ ඔහු පුරුෂයකු හේතුව නිසා නම් එවැනි ක්‍රියා මගින් හිංසනයට පත් තැනැත්තාගේ පොදු හෝ පෞද්ගලික ජීවිතයේ නිදහස සිතාමතාම සීමා වන්නේය.
පහත දැක්වෙන ප්‍රචණ්ඩත්වකාරී ක්‍රියාවන්ට යම් තැනැත්තකු ගොදුරු විය හැකි අතර ඊට අමතරව වෙනත් හේතු ද මෙහිදී නිරීක්ෂණය කළ හැකි බව සලකන්න.

1. පවුල තුළ සිදුවන ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන්ට ශාරීරික, ලිංගික හා මානසික හිංසන ක්‍රියාවන් ඇතුලත්වන අතර එහිදී පහරදීම්, ලිංගික සූරාකෑම්, හා අපයෝජන, දරුවන්ට සිදු කරන ලිංගික අපයෝජන, දෑවැද්ද හේතු කරගෙන සිදු කරන ප්‍රචණ්ඩකාරී ක්‍රියා, වෛවාහික දූෂණය, දැරියන් සුන්නත් කිරීම, කාන්තාවන්ට සහ දැරියන්ට සිදු කරන චාරිත්‍ර සහ අභිචාරී කටයුතු තුළින් හිංසනයට පත් කිරීම, විවාහ නොවූ දෙපාර්ශවයක් අතර සිදුවන ගැටුම්, සහ හිංසාකාරී සූරාකෑම් ආශ්‍රිතව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා හැඳින්විය හැකිය.

2. සාමාන්‍යය ප්‍රජාව තුළ සිදුවන ශාරීරික, ලිංගික හා මානසික ප්‍රචණ්ඩ ක්‍රියා අතර දූෂණය, ලිංගික අපයෝජනය, රැකියා කරන ස්ථානවල, අධ්‍යාපන ආයතන සහ වෙනත් ස්ථානවල සිදුවන බලපෑම් සහ කාන්තාවන් අනීතිකව පැහැර ගෙන ගොස් ලිංගික කටයුතු සහ වෛශ්‍යා සේවයේ යෙදවීම ආදිය ද ඇතුළත් වේ.
3. කුමන ස්ථානයක හෝ රජයේ අනුදැනුම මත සිදුවන ශාරීරික, මානසික හෝ ලිංගික හිරිහැර.

## කාන්තාවන්ට සහ දැරියන්ට සිදුවන ප්‍රචණ්ඩත්වය නිර්වචනය කිරීම:

කාන්තාවන්ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවන් කිසිදු සීමාවකට යටත් නොවී පහත දැක්වෙන අයුරින් නිර්වචනය කළ හැකිය.

"දූෂණය, ලිංගික අඩත්තේට්ටම්, ලිංගික අපයෝජනය, සහ රැකියා ස්ථානයන් හි සිදු කරන පීඩාවන් ඇතුළුව කාන්තාවන්ට සිදු කරන සියළු ආකාරයේ ශාරීරික, ලිංගික හෝ මානසික ප්‍රචණ්ඩ ක්‍රියාවන් සහ කාන්තාවන් බලහත්කාරයෙන් වෛශ්‍යා සේවයේ යෙදවීම අරමුණු කර ගෙන සිදුකරන අනීතික ප්‍රවාහනය කිරීම්, ආදිය යි."

(කාන්තාවන් කෙරෙහි සිදුවන සියළු ආකාරයේ ප්‍රචණ්ඩකාරී ක්‍රියා වැලැක්වීම් ප්‍රඥප්තියේ 2.2 වගන්තිය)

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය:

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය යනු යම් තැනැත්තකුගේ ලිංගිකත්වය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදු කරනු ලබන ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්ය. මෙහිදී යම් යම් ක්‍රියාවන්, පීඩනයන්, බලපෑම් සහ නිදහස සීමා කිරීම් මගින් ශාරීරික, මානසික හෝ ලිංගික අඩත්තේට්ටම් කිරීම් හා පීඩාකාරී ක්‍රියාවන් එවැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියා ලෙස සැලකිය හැකිය.

ස්ත්‍රීන්, පුරුෂයන් පිරිමි සහ ගැහැණු දරුවන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ගොදුරු විය හැකි අතර මෙහිදී මූලික වශයෙන් ස්ත්‍රීන් සහ ගැහැණු දරුවන් එවැනි තත්වයන්ට මුහුණපෑමේ ප්‍රවණතාවය වැඩි බව නිරීක්ෂණය වෙයි.

## ලිංගික සූරාකෑම් යන්නෙහි නිර්වචනය:

යම් තැනැත්තකුගේ විශ්වාසය, අවදානමට පත්වීමට ඇති හැකියාව හෝ දුබලතාවන් යන හේතු පදනම් කර ගෙන ඔවුන්ව ලිංගික කරුණු අරමුණු කර සිදු කරනු ලබන අපයෝජන හා හිංසාවන් ලිංගික සූරාකෑම් ලෙස නිර්වචනය කළ හැකිය. මෙහිදී මූල්‍යය, සමාජයීය හෝ දේශපාලන වශයෙන් හෝ වෙනත් යම් ආකාරයකට තෙවැනි පාර්ශවයකින් වාසි ලබා ගැනීමේ අරමුණින් සිදු කරනු ලබන ලිංගික සූරාකෑමේ ක්‍රියාවන් ද ඇතුලත් වේ. මෙහිදී වින්දිතයාට එම ලිංගික සූරාකෑම් තත්වය නැවැත්වීමට යම් තීරණයකට එළඹීම හැකියාවක් හෝ බලයක් නොමැති වන අවස්ථාවකදී එම තැනැත්තා මත පීඩනය හෝ බලය යොදා අපයෝජනයට ලක් කිරීම සිදු කරනු ලබයි.

ප්‍රශ්ණ සහ ගැටළු සාකච්ඡා කිරීම:

## 3 වන සැසිය

# ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමට සහ එයට ප්‍රතිචාර දැක්වීම පිළිබඳව විවිධ ආකාරයෙන් ප්‍රවේශ වීම.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය අවම කිරීම පිණිස විවිධ ආකාරයෙන් ප්‍රවේශවීම තුළ අවම ක්‍රියාකාරකම් මගින් එම තත්වයන් මැඩ පවත්වා ගැනීම සහ ප්‍රතිචාර දැක්වීම.

### අරමුණ -

1. එක් එක් පරිසරය තුළ එයට ආවේනික හේතු මත සිදුවන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා බලපාන මූලික කරුණු හඳුනාගෙන ඒ සඳහා ක්‍රමෝපායික ප්‍රවේශයක් තුළ එම තත්වයන් අවම කිරීමට සැලසුමක් සකස් කිරීම.

2. වින්දිතභාවයෙන් අත්මිදුණු තැනැත්තන්ට (survivor) අවශ්‍යය කඩිනම් සහාය ලබාදීමේ අවශ්‍යතාවය තේරුම් ගැනීම, සහ විවිධ පාර්ශවකරුවන් හා එක්වී කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය සකස් කිරීම.

3. සියළු ආයතන සහ විවිධ පාර්ශවයන් මනා ලෙස සම්බන්ධීකරණය කරමින් ප්‍රචණ්ඩත්වය අවම කිරීමට හෝ වලක්වා ගැනීමට ඇති ප්‍රවේශය පිළිබඳ මනා අවබෝධයක් ඇති කිරීම.

### ප්‍රධාන ඉගෙනුම් කරුණු -

- වින්දිතභාවයෙන් මිදුනු තැනැත්තන්ට අවශ්‍යය ඵලදායි ප්‍රතිචාර - ප්‍රචණ්ඩත්වයට ලක්වූ තැනැත්තකු ගේ සෞඛ්‍යය, මානසික, සමාජයීය සහ ආරක්ෂාව පිළිබඳ ප්‍රතිචාර දැක්වීමේදී එය ලබාගැනීමට ඇති හැකියාව, සානුකම්පිත බව, ගෞරවය සහ රහස්‍යයභාවය සුරැකීම කෙරෙහි අවධානය යොමු කිරීම.
- ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් අවම කිරීමට ඵලදායි පියවර ගැනීම - එක් එක් පරිසරය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා ඇතිවීමට සාධක වන මූලික කරුණු පිළිබඳව මනා අවබෝධයක් ඇති කර ගැනීම සහ එවැනි සාධක අවම කර ගැනීම සඳහා අවශ්‍යය ක්‍රමෝපායික සහ ඵලදායි පියවර ගැනීම
- ප්‍රචණ්ඩත්වය අවම කිරීම සහ ප්‍රතිචාර දැක්වීම යන කරුණු දෙක කෙරෙහිම බලපාන ක්‍රියාමාර්ග ගැනීමේදී විවිධ පාර්ශවයන් සහ විවිධ ප්‍රවේශයන් තුළ ආයතන සහ කණ්ඩායම් එක්ව කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ.
- මෙම විවිධ පාර්ශව සහ ප්‍රවේශයන් මනා ලෙස සම්බන්ධ කිරීම, සන්නිවේදනය සහ සහයෝගීතා ගොඩනැගීම තුළින් අභියෝගාත්මක එහෙත් ඵලදායි ක්‍රමවේද සැකසීම තුළින් ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමෝපායික සැලසුම් සකස් කළ හැකිය.

## සැසිය 3.1 - ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ විවිධ ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියා

කාලය - විනාඩි 30.

මෙම සැසිය තුළ විවිධ ප්‍රචණ්ඩකාරී ක්‍රියා පිළිබඳව සහභාගීවන්නන්ට මතක හිටින ආකාරයේ මෙවලමක් (ගසක්) ආශ්‍රයෙන් පැහැදිලි කර දෙනු ඇත.

සැසියේ අරමුණ -

සහභාගීවන්නන්ට මතක සිටින ආකාරයෙන් විවිධාකාරයෙන් සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා හඳුනා ගැනීමේ ක්‍රමය පැහැදිලි කිරීම

### ක්‍රමවේදය -

පියවර 1:
ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්වූ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ උදාහරණ කීපයක් සපයන ලෙස කණ්ඩායමෙන් ඉල්ලා සිටින්න. උදාහරණ සංඛ්‍යාව උපරිම 5-8 කට සීමා කරන්න. මෙහිදී දෙවන පියවරේ සඳහන් උදාහරණ කීපයක් ඇතුලත් කරන්න.

සමහර උදාහරණ ලෙස - දූෂණය, ගෘහස්ත ප්‍රචණ්ඩත්වය, ලිංගික සූරාකෑම් ඇතුලත් කරන්න


සහභාගීවන සමහර පිරිස ලිංගිකත්වය මත පදනම් නොවූ ප්‍රචණ්ඩ ක්‍රියා සඳහන් කළ හැකිය.

උදාහරණ - දරුවන්ට සිදුවන පහරදීම් ආදිය. එවැනි අවස්ථාවකදී නැවත ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ නිර්වචනය සිහිපත් කරන්න. සමාජයේ විවිධ ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවන අතර ලිංගිකත්වය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සමහර අවස්ථාවන්හි දී වෙන් කර දැක්වීමට අපහසු බව තහවුරු කරන්න. එවැනි අවස්ථාවන්හි දී මේ ආකාරයෙන්ම සහයෝගය දැක්විය හැකි අතර මෙම සැසියේදී අප විශේෂ අවධානය යොමු කරන්නේ ලිංගිකත්වය මත පදනම් වූ ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා බව අවධාරණය කරන්න.

පියවර 2:
පහත දැක්වෙන විවිධ ප්‍රචණ්ඩ ක්‍රියා ගසක චිත්‍රයක කඳ මත සලකුණු කරන්න පියවර 1 සඳහන් පරිදි,

- ලිංගික
- ශාරීරික
- මානසික - සමාජයීය
- ආර්ථික
- පීඩාකාරී ආකාරයෙන් සිදුකරන සාම්ප්‍රදායික අභිචාර

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳව රූපසටහනේ ඇති මේ ගසේ මුල්, කඳ සහ අතු ඇති බව පැහැදිලි කරන්න. කඳ මගින් නිරූපණය වන්නේ විවිධ ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ය. අපි මෙම ගසේ මුල් සහ අතු පිළිබඳව පසුව සාකච්ඡා කරමු.




පියවර 3:

1. සහභාගීවන්නන් කුඩා කණ්ඩායම් 2කට හෝ 3කට වෙන් කරන්න. 2වන අදියරේ දී සඳහන් කළ පරිදි විවිධ වූ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව ලැයිස්තුවක් සකස් කරන්න.
2. මෙවැනි විවිධ ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියා සඳහා නිදසුන් සාකච්ඡා කරන්න උපදෙස් ලබා දෙන්න. මෙම උදාහරණ ෆිලිප් චාට් කඩදාසි මත සටහන් කරන්න. මෙම කණ්ඩායම් ක්‍රියාවට විනාඩි 20 පමණ කාලයක් ලබා දෙන්න.
3. මෙම කණ්ඩායම් ක්‍රියාව අවසානයේ එක් එක් කණ්ඩායමේ ෆිලිප් චාට් කඩදාසි ප්‍රදර්ශනය කරන්න. අනිත් කණ්ඩායම්වල පිරිස මෙම නිදසුන් නිරීක්ෂණය කරන්න. සෑම කණ්ඩායමකින් එක් අයකු අන් අයගේ ප්‍රශ්නවලට පිළිතුරුදීම සඳහා තමන්ගේ ෆිලිප් චාට් කඩදාසිය ආසන්නයේ රැදී සිටින්න. "Gallery Walk" ක්‍රමවේදය භාවිතා කරන්න. මේ සඳහා විනාඩි 5-10 කාලයක් වෙන් කරන්න.
4. තමන්ගේ අසුන වෙත එන ලෙස දන්වන්න. පහත දැක්වෙන ප්‍රශ්න සාකච්ඡා කරන්න. මේ සඳහා විනාඩි 5 ක් පමණ ගත කරන්න.
   - යම් කණ්ඩායමක් විසින් දක්වා ඇති කිසියම් නිදසුනක් සමග ඔබ එකග නොවේද?
   - යම් කණ්ඩායමක නිදසුනක් ඔබ පුදුමයට පත් කළාද?
   - යම් නිදසුන් පොදු නිදසුන් ලෙස කණ්ඩායම් කීපයක් සඳහන් කර තිබේද?
5. සාරාංශ ගත කිරීමෙන් අනතුරුව, අවසන් කරන්න. ෆිලිප් කඩදාසි ඊළඟ ක්‍රියාකාරකම සඳහා රඳවා තබන්න.

## සාකච්ඡා කළ යුතු ප්‍රධාන කරුණු -

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය
- ලිංගික ප්‍රචණ්ඩත්වය
    - හිරිහැර කිරීම
    - දූෂණය කිරීම
    - මෛථුනයේ යෙදීම
    - දූෂණය කිරීමට තැත් කිරීම
    - වෛවාහික දූෂණය
    - අපයෝජනය
    - දරුවන්ට ලිංගික හිංසන සිදු කිරීම/ ලේ ඥාතීන් අතර සිදුවන ලිංගික ක්‍රියා උදා - සහෝදර සහෝදරියන් අතර පියා දුව අතර
    - බලහත්කාරකමින් ලිංගික ක්‍රියාවල යෙදීම
    - බලහත්කාරකමින් වෛශ්‍යයා සේවයේ යෙදවීම, සමහරවිට එය කැමැත්තෙන් සිදු කරන ක්‍රියාවලක් ලෙස පෙනී ගියත් එය ස්වේච්ඡාවෙන් සිදු කරන ක්‍රියාවක් නොවිය හැකිය. ළමයින් වෛශ්‍යයා වෘත්තියේ යෙදවීම
    - ලිංගික කටයුතු සඳහා පුද්ගලයන් ප්‍රවාහනය
    - පීඩාකාරී සම්ප්‍රදායික අභිචාර විධි.
- ශාරීරික හිංසනයන්
    - සහකරු/සහකාරියට පහරදීම/ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය
    - ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනත් ශාරීරික හිංසනයන්
    - පීඩාකාරී අභිචාර විධි
    - මානසික හා සාමාජයීය හිංසනයන්
- වාචික සහ මානසික හිංසනයන්
    - ලැජ්ජාවට පත් කිරීම
    - වෙනස්කොට සැලකීම
    - අවස්ථාවන් ලබා නොදීම/සේවාවන් ලබා නොදීම
    - සහකරු/සහකාරිය සිර කර තබා ගැනීම (ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය)
    - පීඩාකාරී සිරිත් විරිත්/අභිචාර විධි
- ආර්ථික - ඉහත දක්වා ඇති අවස්ථාවලදී සිදුවිය හැකි ආර්ථික හානි.
- පීඩාකාරී සිරිත් විරිත්/අභිචාර - ඉහත දක්වා ඇති විවිධ මාදිලියේ හිංසනයන්ට යටත් වූ සිරිත් විරිත්/අභිචාර මෙයට ඇතුලත් වේ. මෙම මාතෘකාව යටතේ කටයුතු කරන විට එක් එක් ප්‍රදේශයේ පවතින සංස්කෘතිය පිළිබඳ දැනුම සහ සංවේදීතාව වැදගත් වේ. සාකච්ඡාව තුළදී කාලයක් පුරා පැවතෙන සංස්කෘතික කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම ද වැදගත් වේ.
    - අඩු වයස්/බලහත්කාරයෙන් සිදු කරන විවාහ
    - දැවැද්ද මුල් කරගෙන සිදු කරන හිංසනයන්
    - යම් යම් සංස්කෘතික ඇවතුම් පැවැතුම්වලට එකග නොවීම හේතුවෙන් කාන්තාවන්ට දෙන දඬුවම්
    - කාන්තාවන්ට සහ ගැහැණු දරුවන්ට තමන් වෙත පැවැරී ඇති විවිධ වගකීම් සහ වැඩ කටයුතු හේතුවෙන් ආහාර සහ අධ්‍යාපනය අහිමි කිරීම

## 3.2 සැසිය - බලපාන සාධක සහ හේතු

කාලය - විනාඩි 15.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයට පාදක වන සියළු හේතූන් මෙහිදී සාකච්ඡා කරනු ඇත. මෙම සැසිය ඊළඟ සැසියට අවශ්‍ය පසුබිම සකස් කරන අතර සහභාගීවන්නන්ට ස්ත්‍රී පුරුෂ සමාජභාවයට බලපාන මූලික සාධක පිළිබඳ අවබෝධයක් ලැබෙනු ඇත.

### සැසියේ අරමුණ -

1.සියළු ආකාරයෙන් සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවලට හේතුවන මූලික සාධක පිළිබඳ දැනුම වැඩි කිරීම.

2.එක් එක් පරිසරයට ආවේනික වූ කරුණු මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා සහ එයට හේතුවිය හැකි කරුණු පිළිබඳව අවබෝධ කර ගැනීම.

### ක්‍රමවේදය -

1.ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය අවම කිරීමේ වැඩසටහනක් සකස් කිරීමේදී එයට සාධක වන කරුණු පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතු වේ.

2.ගසක චිත්‍රයට අවධානය යොමු කරන්න. එයට හේතු සාධක වන කරුණු පිළිබඳ සහභාගීවන්නන් ගෙන් කරුණු විමසන්න. ගසේ මුල් සහිත කොටස ගැන සාකච්ඡා කරන්න. එමගින් පෙන්වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයට හේතුවන කරුණු වන අතර ඒ පිළිබඳව ගැඹුරින් සාකච්ඡා කරන්න.

3.ප්‍රචණ්ඩත්වයට හේතුවන සාධක සාකච්ඡා කරන්න. හේතු සහ සාධක අතර ඇති වෙනස කුමක් දැයි සාකච්ඡා කර එම කරුණු එකිනෙක වෙනස් බව අවබෝධ කර ගැනීමට සහභාගීවන්නන්ව යොමු කරන්න.

4.ගසේ චිත්‍රයේ මුල් වලින් දක්වා ඇති කොටසට අවධානය යොමු කරන්න. එම කොටසින් පෙන්වන්නේ ප්‍රචණ්ඩත්වයට හේතුවන මූලික කරුණු වන අතර ඒවා රතු පාට හෝ වෙනත් වර්ණයකින් රවුම් කරන්න.

## සාකච්ඡා කළ යුතු මූලික ප්‍රධාන කරුණු -

- ප්‍රචණ්ඩත්වයට මූලික වන කරුණු - යම් සමාජයක ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි ඇති සමාජ සම්මතයන්, බලය සහ වෙනස් ආකාරයෙන් සැලකීමට ඇති හැකියාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව යම් පුද්ගලයකුගේ භූමිකාව, වගකීම්, සීමාවන්, වරප්‍රසාද සහ අවස්ථාවන් ආදිය ලබා ගැනීමට ඇති හැකියාව ඇතුළු ප්‍රචණ්ඩත්වයට හේතුවන මූලික සාධකවලට අවධානය යොමු කිරීම.

එම කරුණු සඳහා පිළියම් සෙවීම හා ක්‍රියාත්මක කිරීම දිගු කාලීන ක්‍රියාවලියක් වන අතර එමගින් යම් වෙනස්කම් සිදුකිරීම මගින් ප්‍රචණ්ඩත්වය අවම කිරීමට ඉතාමත් දිගු කාලයක් ගත වුව ද එමගින් තිරසාර වෙනස්කම් සිදු කර ප්‍රචණ්ඩත්වය අවම කිරීමට හැකිවනු ඇත.

- ප්‍රචණ්ඩත්වයට දායකවන සාධක - ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදුවන ප්‍රචණ්ඩත්වයට දායක වන සාධක සහ අවධානම්වලට තුඩු දෙන හේතු මෙන්ම පරිසරය මෙහිදී සැලකිල්ලට ගත යුතුයි. ප්‍රචණ්ඩත්වයට හේතුවන සාධක ප්‍රචණ්ඩත්වය ඇති කිරීමට හේතු නොවන අතර එය ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සමඟ යම් සබඳතාවයක් පවතී. පහත උදාහරණ විමසන්න.

- මද්‍යසාර/මත්ද්‍රව්‍ය

- යුද්ධමය වාතාවරණ, අවතැන්වීම්, ආයුධ සන්නද්ධ පුද්ගලයින් ආදී තත්වයන් මෙහිදී ප්‍රචණ්ඩත්වයට දායකවන කරුණු ලෙස සැලකිය හැකි අතර මෙහිදී හමුදා සොල්දාදුවන් බොහෝ දෙනෙක් එවැනි පීඩාකාරී තත්වයන්ට යොමු නොවන බව සිහිපත් කළ යුතුවේ.

- දරිද්‍රතාවය ද ප්‍රචණ්ඩත්වයට ගොදුරුවීමට බලපාන කරුණක් වන අතර සියළු දරිද්‍ර කාන්තාවන් වෛශ්‍යා වෘත්තියට යොමුකිරීම හෝ ලිංගික අඩත්තේට්ටම් සිදු කිරීම වැනි තත්වයන්ට ගොදුරු නොවේ.

- ප්‍රචණ්ඩත්වය, බොහෝවිට එයට දායක වන සාධක අවම කිරීම මගින් සැලකිය යුතු ප්‍රමාණයකින් අවම කළ හැකිය.

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට හේතුවන මූලික සාධක -

- පුරුෂයන් සහ/හෝ කාන්තාවන් කෙරෙහි යම් සමාජයක දක්වන ආකල්පය විශේෂයෙන්ම කාන්තාවන්ට ගරු නොකිරීම හෝ නොසලකා හැරීම වැනි කරුණු.
- මානව හිමිකම් සියළුදෙනාටම එක හා සමානව ඇති අයිතියක් යන්න විශ්වාස නොකිරීම.
- සමාජ/සංස්කෘති පිලිවෙත් තුළ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ඇති අසමාන ස්වභාවය. ස්ත්‍රීන් හෝ ස්ත්‍රීන් විසින් සිදු කරන යම් කාර්යයන් අගය නොකිරීම.

## ප්‍රචණ්ඩත්වයට දායකවිය හැකි හෝ ප්‍රචණ්ඩත්වය පැවැතීමට හේතුවන කරුණු -

- මත්ද්‍රව්‍ය/මත්පැන් හේතුවෙන් සිදුවන අපයෝජන.
- දරිද්‍රතාවය.
- ආහාර ලබා ගැනීමට, දරකැඩීමට ජලය ලබා ගැනීමට හෝ වෙනත් ආදායම් මාර්ග සඳහා කාන්තාවන්ට පාළු ස්ථානවලට යෑමට සිදුවීම.
- රැකියා අවස්ථාවන් නොමැතිවීම, පාළුව හා කාන්සිය, විනෝදවීමට හෝ වෙනත් සාමාජයීය කටයුතුවල නියැලීමට අවස්ථාවක් නොමැතිවීම.
- සාම්ප්‍රදායික සමාජ ක්‍රම සහ පවුලේ සහයෝගය නොමැතිවීම.
- ආගමික, සංස්කෘතික හෝ/පවුල්වල ඇති ඇදහිලි සහ විස්වාස.
- නීතිය නිසි ආකාරයෙන් ක්‍රියාත්මක නොවීම.
- භූගෝලීය පිහිටීම/පරිසරය (අපරාධ සිදුවන ප්‍රදේශ, හුදකලා සහ මිනිස්සු නොගැවසෙන ස්ථාන ආදිය)
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහි ප්‍රමාණවත් නීති නොමැතිවීම.
- පොලීසියෙන් අවශ්‍යය රැකවරණය නොලැබීම සහ ප්‍රතිචාර දැක්වීමට දීර්ඝ කාලයක් ගැනීම.
- රාජ්‍යය ආයතන නිසි ආකාරයෙන් ක්‍රියාත්මක නොවීම. උදාහරණයක් ලෙස පොලිස් ස්ථානයේ හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාන්තාවන් සහ දරුවන් වෙනුවෙන් වෙන් කර ඇති සේවාවන් නිසි ආකාරයෙන් ක්‍රියාත්මක නොවීම.
- නීතියේ සාධාරණත්වය ඉටුවීම කාලය ගතවීම.
- පුරුෂයන් ගේ බලය හා රැකවරණය/පවුලේ හෝ ප්‍රජාවේ භූමිකාව නිසි ආකාරයෙන් ඉටු නොවීම.

## 3.3 සැසිය - අවම කිරීමේ ක්‍රමෝපායන්

කාලය - පැය 1.

ප්‍රචණ්ඩත්වය අවම කිරීමේ ක්‍රමෝපායන් පිළිබඳව මෙම සැසියේ දී සාකච්ඡා කරයි.

### සැසියේ අරමුණ -

ප්‍රචණ්ඩත්වය ඇතිවීමට හේතු සහ සාධක විමසා බැලීම තුළින් එම තත්වයන් අවම කිරීමට ඵලදායි ක්‍රමෝපායන් සකස් කිරීමට ඇති හැකියාව වර්ධනය කිරීම.

### ක්‍රමවේදය -

1. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය නිරූපිත ගස කෙරෙහි අවධානය යොමු කරන්න. එහි ප්‍රචණ්ඩත්වයට දායක වන හේතු සහ සාධක විමසා බලන්න. මෙම කරුණු පිළිබඳ අවබෝධය විශේෂයෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාල ගැටළු පිළිබඳ ප්‍රජාවේ සම්මතයන් පිළිබඳව මනා අවබෝධය ප්‍රචණ්ඩත්වය අවම කිරීම සඳහා ක්‍රමෝපායික සැලැස්මක් සකස් කිරීමේදී වැදගත් වේ.

2. මෙම සැසිය මගින් ප්‍රචණ්ඩත්වය ඇතිවීමට බලපාන මූලික කරුණු සහ දායක වන සාධක කෙරෙහි අවධානය යොමු කර එම තත්වයන් අවම කිරීමට භාවිතා කළ හැකි විවිධ ක්‍රමෝපායන් පිළිබඳව සලකා බලනු ඇත.

3. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය නිරූපිත ගස මගින් පෙන්වා දි ඇති මූලික කරුණු නැවතත් විමසා බලන්න.

- සමාජ/සංස්කෘතික සම්මතයන්/සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ පවතින වෙනස්කම්
- පවුලේ සහ ප්‍රජාවේ පවතින සහයෝගීතාව බිඳ වැටීම, සමාජ ගැටළු, එවැනි තත්වයන් ඇත කරන පුද්ගලයන්ට සමාජය මගින් පනවා ඇති බාධක/තහංචි.
- පොලිස් ස්ථානයේ ඇති කාන්තාවන් සඳහා වෙන් වූ සහන සේවාවට, අධිකරණ වෛද්‍ය නිලධාරීතුමන් වෙත හෝ, මනෝ චිකිත්සක සේවාවන් වැනි වින්දිතයන්ට සේවා සපයන ආයතන සහ පුද්ගලයන් සමඟ සම්බන්ධවීමට ප්‍රවේශයක්/අවකාශයක් නොමැතිවීම.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහිවීමට ජාතික වශයෙන් නීති පද්ධතියක් හෝ සාම්ප්‍රදායික ක්‍රමවේද සහ අධිකරණ ක්‍රමයක් නොමැතිවීම.
- චූදියන්ට දඬුවම්දීමට දිගු කාලයක් ගතවීම.

## ක්‍රියාකාරකම් -

ඉහත දක්වා ඇති කරුණු කෙරහි බලපෑම් ඇති කිරීමට හැකි ක්‍රමෝපායන් හඳුනා ගන්නා ලෙස සහභාගිවන්නන් ගෙන් ඉල්ලා සිටින්න. ඔවුන් ඉදිරිපත් කරන ලද ප්‍රධාන කරුණු සම්පිණ්ඩනය කර සාකච්ඡා කරන්න.

## සාකච්ඡා කරන ප්‍රධාන කරුණු -

### ප්‍රචණ්ඩත්වය වලක්වා ගැනීම:

ප්‍රචණ්ඩත්වය ඇතිවීමට හේතුවන කරුණු සහ දායක වන සාධක අවබෝධ කර ගැනීම සහ එම තත්වයන් අවම කර ගැනීම හෝ වලක්වා ගැනීමට අවශ්‍යය ක්‍රමෝපායන් සකස් කර ගැනීම

ප්‍රචණ්ඩත්වය වලක්වා ගැනීම දිගුකාලීන ක්‍රියාවලියක් වන අතර එහිදී මනා පසුවිපරම් ක්‍රමවේදයක් සකස් කර ගැනීම තුළින් ක්‍රියාවලිය උපරිම ඵලදායි ප්‍රතිඵල ලබා ගත හැකි පරිදි අවශ්‍ය ලෙස වෙනස්කම් වරින් වර සිදු කරමින් ක්‍රියාත්මක කළ හැකිය. මෙම ක්‍රියාවලිය ද යම් කිසි ව්‍යාපෘතියක් හෝ වැඩසටහනක් සකස් කිරීමේ ක්‍රියාවලියට සමාන වේ. මෙහිදී මනා තක්සේරුවක්,සැලසුමක්, පසු විපරම් ක්‍රියාවලියක්, සහ සම්පත් (මානව, මූල්‍යය සහ තාක්ෂණික) ආදිය අවශ්‍ය වේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට මූලික වන කරුණු දිගුකාලීන සංස්කෘතික සම්මතයන්ගේ ප්‍රතිඵලයක් විය හැකිය. එවැනි සම්මතයන් වෙනස් කිරීම පරම්පරා ගණනාවක් සමඟ ක්‍රියාත්මක කරන ලද සැලසුමක ප්‍රතිඵලයක් විය හැකි අතර එවැනි දිගුකාලීන ක්‍රියාවලියක් තුළ සිදුවන සමාජ වෙනස්කම් සැබැවින්ම ප්‍රචණ්ඩත්වය අවම කිරීමට හෝ තුරන් කිරීමට දායක වනු ඇත.

සියළු ප්‍රචණ්ඩ ක්‍රියාවන් තුළ වූදිතයකු සහ වින්දිතයකු සිටියි. එම නිසා ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ ක්‍රමෝපායක් සකස් කිරීමේදී චූදිතයන් සහ වින්දිතයන් විය හැකි දෙපිරිසම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

## 3.4 සැසිය - ප්‍රචණ්ඩත්වයට මුහුණදීමේ ප්‍රතිඵල

කාලය - විනාඩි 30

ප්‍රචණ්ඩත්වයට ලක් වූ වින්දිතයන් විවිධ ආකාරයේ සෞඛ්‍යය, මානසික සහ සාමාජයීය ගැටළුවලට ගොදුරු වේ. මෙම සැසියේදී එවැනි විවිධ ආකාරයේ ප්‍රතිඵල සවිස්තරාත්මකව විමසා බලයි. වින්දිතයන්ට ඇති විය හැකි ප්‍රතිඵලවල ස්වභාවය සහ පරාසය අවබෝධ කර ගැනීම මගින් කඩිනමින් ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේද/සේවාවන් හඳුනා ගත හැකිය.

### සැසියේ අරමුණ -

විවිධ ආකාරයේ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ වින්දිතයන්ට ඇතිවිය හැකි තත්වයන් පැහැදිලි කිරීම

### ක්‍රමවේදය -

1. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ ප්‍රතිඵල/ඇති විය හැකි තත්වයන් යන මාතෘකාව ෆලිප් චාට් කඩදාසියක ලියන්න. එයට උදාහරණ කීපයක් සඳහන් කරන ලෙස සහභාගීවන පිරිසට පවසන්න. සෞඛ්‍යය, මානසික සහ සාමාජයීය යන විවිධ කරුණු වෙන් කර දැක්වීම සඳහා වෙනස් වර්ණ භාවිතා කරන්න.
2. පහත දැක්වෙන උදාහරණ සාකච්ඡා කරන්න
3. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන ප්‍රචණ්ඩත්වය නිරූපිත ගස වෙත අවධානය යොමු කර මෙහි සඳහන් වැදගත් උදාහරණ කීපයක් ලියන්න. එම උදාහරණ ගසේ අතුවලින් දක්වා ඇති බව පැහැදිලි කරන්න.
4. ප්‍රචණ්ඩත්වයට මුහුණපෑමෙන් වින්දිතයන්ට සෞඛ්‍යය සහ මානසික වශයෙන් අහිතකර ප්‍රතිඵල/තත්වයන් ඇතිවිය හැකි බව පැහැදිලි කරන්න.

### සාකච්ඡා කළ යුතු ප්‍රධාන කරුණු -

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව සිදු කරන විවිධ ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් සිදුවන සෞඛ්‍යය, මානසික සහ සාමාජයීය වශයෙන් වූ අහිතකර බලපෑම්.

- සංඛ්‍යා ලේඛන පෙන්වා දෙන පරිදි  මරණයට පත් කිරීම, සියදිවි හානිකර ගැනීම වැනි තත්වයන් ද සිදුවන බව සිහිපත් කරන්න.

- දූෂණයට හෝ ලිංගික අපයෝජනයට ලක්වන තැනැත්තෙකුට සාමාජයීය වශයෙන් සිදුවිය හැකි දැඩි හානිය නම් ඔහු/ඇය ඒ තත්වයට පත්වූයේ තමන්ගේ වරදකින් යැයි පවසමින් සමාජයෙන් එල්ලවිය හැකි අපවාදයි. මෙය දැඩි මානසික කම්පනයට ලක්විය හැකි කරුණක් වන අතර සහනයක් සැලසීම වෙනුවට වින්දිතයා තව තවත් පීඩනයට පත්වීම ඉන් සිදු විය හැකිය. සමහරවිට එවැනි තත්වයන්ට පත්වන තැනැත්තන් සමාජයේ කොන්වීමට හා විවාහයට පත්වීමට නුසුදුසු ලෙස සමාජය විසින් ප්‍රතික්ෂේප කිරීම ද නිරීක්ෂණය කළ හැකිය.

ප්‍රචණ්ඩත්වයට ගොදුරුවී ඉන් බේරුණු තැනැත්තකු නැවත නැවත අපයෝජනයට/අපහරණයට ලක්වීමට බොහෝ ඉඩකඩ ඇත.

## සෞඛ්‍යය වශයෙන් සිදුවන බලපෑම් -

සියළු ආකාරයෙන් සිදුවන ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් ජීවිත තර්ජන පවා ඇතිවිය හැකි තත්වයේ බලපෑම් සිදුවිය හැකිය. ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය අනුව සෞඛ්‍යයමය වශයෙන් සිදුවන බලපෑම් වෙනස් විය හැකිය.

- මරණය සිදුවිය හැකි අවස්ථාවන්
    - සෘජුව මරණයට පත් කිරීම
    - සියදිවි හානි කර ගැනීම
    - ගැබිණියන් මරණයට පත්වීම
    - ළදරුවන් මරණයට පත්වීම
    - රෝග ආසාදනය හේතුවෙන් මරණයට පත්වීම
    - දැඩි ලෙස ශරීරයට හානි පැමිණීම හේතුවෙන් ඇතිවන දිගුකාලීන අබාධ
    - ශරීරයට සිදුවූ හානි
    - කම්පනය
    - විවිධ රෝගාබාධ
    - ආසාදන තත්වයන්

- නිදන්ගත රෝගාබාධ
    - ආබාධිත තත්වයන්ට පත්වීම
    - ශාරීරික වේදනාවන්
    - නිදන්ගත ආසාදන
    - නිදන්ගත වේදනාවන්
    - ගැස්ට්‍රයිටිස් වැනි රෝග තත්වයන්
    - ආහාර අරුචිය
    - නින්ද නොයෑම
    - මත්ද්‍රව්‍ය/මධ්‍යසාරවලට යොමුවීම

- මාතෘ සෞඛ්‍යය
    - ගබ්සාවීම්
    - අනවශ්‍යය දරු උපත්
    - අනාරක්ෂිත ගබ්සා කිරීම්
    - ලිංගාශ්‍රිත සමාජ රෝග
    - මානසික ව්‍යාකූලතාවයන්
    - ගැබ් ගැනීමේදී ඇතිවිය හැකි සංකූලතා සහ නිසරු බවට පත්වීම
    - නාරි රෝග (මාතෘ සහ කාන්තාවන්ට සුවිශේෂී රෝග සෑදීම)
    - ලිංගික ආබාධ

## මානසික/චිත්තවේගීය බලපෑම් -

වින්දිතයකුට ඇතිවන මානසික සහ චිත්තවේගීය ගැටළු අවබෝධ කර ගත යුත්තේ සාමාන්‍යය මනුෂ්‍යයකු භයානක තත්වයකට පත්වූ විට සිදුවන බලපෑමක් හා සමාන ආකාරයේ අවස්ථාවක් ලෙසයි. එහෙත් සමහර අවස්ථාවන්හි දී වින්දිතයන්ට සිදුවන මානසික බලපෑම් සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමට අවශ්‍ය වේ.

- පශ්චාත් කම්පන ආතතිය මගින් ඇතිවන මානසික ආබාධ.
- මානසික ආතතිය
- කාංසාව, බියපත්වීම.
- ක්‍රෝධය
- ලැජ්ජාව, අනාරක්ෂිත බව, තමන් කෙරෙහි ඇති කර ගන්නා වෛරය, තමන්ටම දෝෂාරෝපණය කර ගැනීම.
- මානසික ආබාධ
- සියදිවි හානිකර ගැනීමේ සිතිවිලි සහ තැත්කිරීම්.

## සමාජ බලපෑම් -

වින්දිතයන්ට විශේෂයෙන්ම දූෂණය ලක්වූ තැනැත්තන්ට බැණවැදීම බොහෝ සමාජයන් හි දකින්න ලැබෙන තත්වයකි. සමාජයෙන් සිදුවන මෙවැනි ආකාරයේ බලපෑම් වින්දිතයා ලැජ්ජාවට පත්වීම, තමන් කෙරෙහි ඇතිවන වෛරය, ආතතියට පත්වීම වැනි තව තවත් මානසික වශයෙන් හානිදායක තත්වයකට පත් කරයි. සමාජයෙන් සිදුවන මෙවැනි තත්වයන්ට මුහුණ පෑමට ඇති බිය නිසා බොහෝ වින්දිතයන් තමා ප්‍රචණ්ඩත්වයට ලක් වූ බව වාර්තා කිරීමෙන් වැලකී සිටින අතර ඒ නිසා වින්දිතයන්ට අවශ්‍යය සුදුසු මානසික සහාය සහ සෞඛ්‍යය සේවා ලබා ගැනීමේ අවකාශය නොලැබී යා හැකිය.

සමාජයෙන් ඇතිවිය හැකි බලපෑම්,

- වින්දිතයාට බැණ වැදීම.
- සමාජයේ යම් යම් කාර්යයන් කිරීමට ඇති අවකාශය අහිමිවීම (උදා - ආදායමක් ලබා ගැනීමට හැකි කාර්යයන්හි නියැලීම, දරුවන් රැක බලාගැනීම)
- සමාජ අපකීර්තිය.
- සමාජයෙන් කොන් කිරීම, ප්‍රතික්ෂේප කිරීම.
- ස්වාමිපුරුෂයා විසින් ප්‍රතික්ෂේප කිරීම.

## 3.5 සැසිය - ප්‍රතිචාර දැක්වීමේ සේවාවන්

කාලය - විනාඩි 10.

ප්‍රචණ්ඩත්වය හේතුවෙන් වින්දිතයන්ට තවදුරටත් සිදුවිය හැකි කම්පනයන්, සහ හානිය අවම කර ගැනීම සඳහා වූ නිර්දේශිත ප්‍රතිචාරාත්මක සේවාවන් පිළිබඳව දැනුම්වත් කිරීමට මෙම සැසියෙන් පියවර ගැනේ. මෙහිදී මූලික වශයෙන් විශේෂිත ආකාර හතරක් අරමුණු කර ගෙන ප්‍රතිචාරාත්මක සේවාවන් පිළිබඳ සාකච්ඡා කරන අතර එහිදී ආයතන අතර ඇති අන්තර් සම්බන්ධීකරණය සහ විවිධ ප්‍රවේශයන් සැලකිල්ලට ගැනේ.

### සැසියේ අරමුණ -

1. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් ඇතිවූ බලපෑම්/ප්‍රතිඵල හා එයට ප්‍රතිචාර දැක්වීමේ සේවාවන් අතර ඇති සබඳතාව පැහැදිලි කිරීම.
2. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමේ සේවාවන් සැපයීමේ දී කඩිනමින් සැපයිය හැකි අවම සේවා මට්ටම් හඳුනාගැනීම වැදගත් වේ. එමගින් ප්‍රචණ්ඩත්වය මගින් සිදුවිය හැකි හානිදායක ප්‍රතිඵල අවම කර ගැනීම මගින් හිංසනය, කම්පනය ආදී තත්වයන් අඩු කර ගත හැකිය.

### ක්‍රමවේදය -

1. ප්‍රචණ්ඩත්වයට මුහුණ පෑමෙන් ඇතිවිය හැකි ප්‍රතිඵල/බලපෑම් පිළිබඳව සහභාගීවන්නන්ට සිහිපත් කරන්න. මෙම සැසිය පුරා එම ලැයිස්තුවට අවධානය යොමු කරන්න

2. ප්‍රචණ්ඩත්වය හේතුවෙන් සිදුවන හානිදායක ප්‍රතිඵල අවම කර ගැනීම සඳහා කවර ආකාරයේ සේවාවන් අවශ්‍යය විය හැකිදැයි සහභාගීවන්නන්ගෙන් විමසන්න. එම සේවාවන් ෆිලිප් කඩදාසියක සටහන් කරන්න. එසේ සටහන් කර ගත් සේවාවන් එක් එක් මාතෘකාවට අදාල පරිදි පහත දැක්වෙන ලෙස වගුවක සටහන් කරන්න.

| සෞඛ්‍යය | මනෝ- සමාජ |
|---|---|
| ● හදිසි ගැබ් ගැනීම් වැලැක්වීම.<br>● ශාරීරික හිංසනයන්ට ප්‍රතිකාර කිරීම.<br>● සමාජ රෝග හා වෙනත් රෝග සඳහා ප්‍රතිකාර කිරීම. | ● මානසික සහාය සහ චිකිත්සක ක්‍රමයන්<br>● ආදායම් උත්පාදන වැඩසටහන්<br>● නිපුණතා වර්ධන වැඩසටහන්<br>● සාමූහික වශයෙන් මනෝ චිකිත්සක සේවාවන් ලබාදීම. |
| **ආරක්ෂිත** | **නීතියේ සාධාරණ ඉටු කිරීම** |
| ● පොලීසියට දැනුම්දීම<br>● සිදුවීම පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම<br>● චූදිතයන් අත්අඩංගුවට ගැනීම<br>● චූදිතයන්ට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම. | ● නෛතික රාමුව තුළ/සම්ප්‍රදායික ක්‍රම<br>● අදාල නීතිරීති ආදිය උපයෝගී කරගෙන චූදිතයන් තමන් සිදු කළ වරදට වගවීමට සැලැස්වීම. |

මෙම සැසිය අවසන් කළ යුත්තේ සහාය කණ්ඩායම්වලට ගුණාත්මක, සහ විවිධ ආයතන සහ විවිධ පාර්ශවයන් සම්බන්ධ කරගෙන වින්දිතයන්ට අවශ්‍යය සහන පියවර ගත හැකි වන්නේ වින්දිතයන් විසින් තමන් මුහුණ පෑ ප්‍රචණ්ඩත්වය පිළිබඳව නිසි ආකාරයෙන් වාර්තා කිරීමට පියවර ගැනීම තුළින් පමණක් වන කරුණ තහවුරු කිරීමෙනි. එම නිසා ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලියේදී ඉහත දක්වා ඇති වගුව තුළ සඳහන් කරුණුවලට එහා ගිය ප්‍රතිචාර/සේවාවන් ද අවශ්‍යය බව සඳහන් කළ යුතුය. ඒ පිළිබඳව ඉදිරි සැසියේ සාකච්ඡා කරනු ඇත.

## සියළු පාර්ශවකරුවන් පුහුණු කිරීම

ප්‍රචණ්ඩකාරී සිදුවීම් වාර්තා කිරීමේ ක්‍රමවේදය සකස් කිරීම සඳහා කාන්තා කමිටුවේ සාමාජිකයන් ප්‍රජාව සමඟ සම්බන්ධ වී කටයුතු කළ යුතු වේ. මෙම ක්‍රියාදාමයේ ප්‍රගතිය විමසා බැලීම සහ අවශ්‍යය සහාය ලබාදීම පිණිස සියළු පාර්ශවකරුවන් මෙහිදී සම්බන්ධ කර ගැනීම වැදගත් වේ.

## සාකච්ඡා කළ යුතු ප්‍රධාන කරුණු -

ප්‍රතිචාර දැක්වීම: ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ වින්දිතයන්ට සිදුවිය හැකි හානිකර තත්වයන් සහ තවදුරටත් ඇතිවිය හැකි මානසික සහ ශාරීරික හිංසනයන් අවම කර ගැනීමට අවශ්‍යය සේවාවන් සහ සහාය දැක්වීම.

ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලියේ දී,

- වින්දිතයන්ට අවශ්‍යය සහාය දැක්වීම.
- චූදිතයන්ට සුදුසු ආකාරයේ බලපෑම් ඇති කිරීම.
- වින්දිතයන්ට සහ ප්‍රචණ්ඩත්වය වාර්තා කරන ප්‍රජාවේ සාමාජිකයන්ට අවශ්‍යය ආරක්ෂාව සැලසීම.

ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලියේදී පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගත යුතු වේ.

- සෞඛ්‍යය පහසුකම්.
- මානසික සහාය.
- මානසික සහ චිත්තාවේග පාලනයට අවශ්‍යය සහාය.
- නැවත සමාජයේ පිළිගැනීමට හා සමාජයට අනුගත කිරීමට සහායවීම.
- ආරක්ෂාව සැලසීම.
- නීතියේ සාධාරණත්වය සැලසීම - නිල වශයෙන් සහ සාම්ප්‍රදායික වශයෙන් ඇති සහායන් ලබාදීම.

සියළුදෙනාම එකිනෙකා හා සහයෝගයෙන් වැඩ කටයුතු ක්‍රියාත්මක කළ යුතුය.

- සියළු වින්දිතයන්ට මේ සියළු ආකාරයේ සහායන් අවශ්‍යය නොවේ. එමෙන්ම ලබාදෙන සහාය ගුණාත්මක මෙන්ම සියළු වින්දිතයන්ට පහසුවෙන් ලබා ගත හැකි ආකාරයෙන් සැලැස්වීමට කමිටු සාමාජිකයන් පියවර ගත යුතු වේ.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ක්‍රියාවලියේ නියැලෙන සියලු පාර්ශවකරුවන් මේ පිළිබඳව දැනුම්වත් කළ යුතුය.
- මනා ලෙස පුහුණු කරනු ලබන ආධාර කණ්ඩායම් වෙත සහාය දිය යුතු වේ. එමෙන්ම වින්දිතයන් මෙම කණ්ඩායම් වෙත යොමු විය යුතුයි. එසේ නොමැති නම් වින්දිතයන් තව තවත් පීඩාවට, කම්පනයට හා හිංසනයට පත්විය හැකිය.

### ප්‍රතිචාර දැක්වීමේදී පහත දැක්වෙන කරුණු ද ඇතුලත් විය යුතුය.

සියළු භූමිකාවන් ඉටු කරන පාර්ශවයන්ට, සියළු ක්ෂේත්‍රයන්ට සහ සියළු ස්ථරවලට අවශ්‍යය පුහුණුව ලබාදිය යුතුය. මෙහිදී ස්වේච්ඡා සේවාවන් හි යෙදෙන පිරිස මෙන්ම අදාල සේවාවන් හි රාජකාරිමය වගකීමක් ඇති පිරිස ද ඇතුලත් විය යුතුය.

- සානුකම්පිත ලෙස, රහස්‍යභාවය සුරැකෙන අයුරින් සහ සුදුසු ආකාරයේ ප්‍රතිචාර දැක්විය යුතුය.
- යොමු කළ යුතු ස්ථානවලට වාර්තා කිරීම
- වාර්තා කළ අවස්ථාවන්, දත්ත විශ්ලේෂණය, පසුවිපරම් සහ ඇගයීම් ආදිය ලේඛණගත කිරීම.
- විවිධ පාර්ශවකරුවන් සහ ආයතන සමඟ සහ සම්බන්ධතාවය සහ තොරතුරු බෙදා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීම.

## 3.6 සැසිය - විවිධ ක්ෂේත්‍රයන් තුළින් ගත හැකි පියවර සඳහා වූ ප්‍රවේශය පිළිබඳ හැඳින්වීම.

කාලය - විනාඩි 15.

ප්‍රචණ්ඩත්වය වැලැක්වීම සහ එයට ප්‍රතිචාර දැක්වීම සඳහා වඩාත් ඵලදායි ලෙස විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ ගත හැකි පියවර සහ එය සම්බන්ධීකරණය කළ හැකි ආකාරය පිළිබඳ මූලික හැඳින්වීමක් මේ සැසිය තුළින් සාකච්ඡා කෙරේ. මෙම සැසිය තුළ සරල මෙවලම් භාවිතයෙන් එවැනි ප්‍රවේශයක ඇති වැදගත්කම තහවුරු කිරීමට අපේක්ෂිතය.

### සැසියේ අරමුණ -

විවිධ ක්ෂේත්‍රයන් තුළින් වූ ප්‍රවේශය මත ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය අවම කර ගැනීමේ වැදගත්කම අවබෝධ කර ගැනීම.

ක්‍රමවේදය -

1. පෙර සැසියන් හි සාකච්ඡා කරන ලද ප්‍රතිචාර සහ වලක්වා ගැනීමේ ක්‍රමෝපායන් කෙරෙහි අවධානය යොමු කරන්න. එහිදී සඳහන් කරන ලද ප්‍රධාන ක්ෂේත්‍ර සතරේ වැදගත්කම හුවා දක්වන්න. එනම් - සෞඛ්‍යය, මනෝ-සමාජයීය, ආරක්ෂාව, සහ නීතියේ සාධාරණත්වය.
2. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේදී මෙම ප්‍රධාන ක්ෂේත්‍ර සතර පුටුවක කකුල් හතරක් මෙන් වැදගත් බවත් ඉන් එක් ක්ෂේත්‍රයක හෝ සහයෝගය නොමැති නම් සාර්ථක ප්‍රතිඵල අත්පත් කර ගැනීමට නොහැකි බව ද අවධාරණය කරන්න. අසල පුටුවක් තිබේ නම් මෙය ක්‍රියාවකින් පෙන්වා දිය හැකිය.
3. මෙම ක්ෂේත්‍ර සතරේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.
4. පුටුවක් කාමරය මැද තබා මෙම සැසිය නිමා කරන්න.

## සාකච්ඡා කළ යුතු වැදගත් කරුණු -

මෙම එක් එක් ක්ෂේත්‍රයන් මගින් එකිනෙකට දක්වන සහයෝගය වඩාත් ප්‍රතිඵලදායි සේවාවක් සඳහා වැදගත් වේ.

## ප්‍රචණ්ඩත්වය ඵලදායි ආකාරයෙන් වලකාලීමේ ක්‍රමවේදයට ඇතුලත් විය යුතු ප්‍රවේශයන්:

- ආරක්ෂාව - ආරක්ෂාව පිළිබඳව ඇති සියළු අවදානම් සහගත තත්වයන් සඳහා ප්‍රමාණවත් පොලිස් ආරක්ෂාව සපයන්න.
- නෛතික - චූදිතයන්ට දඬුවම් ලබා දෙන සහ වින්දිතයන්ට අවශ්‍යය සහාය ලබාදෙන නෛතික පසුබිමක් ගොඩනැගීම. (අවශ්‍යය නීති රීති මෙන්ම, විනිසුරුවරුන්ගේ මහේස්ත්‍රාත්වරුන්ගේ සහ නීතිඥයින්ගේ හැසිරීම සහ ආකල්ප ද මෙහිදී වැදගත් වේ)
- සෞඛ්‍යය - මහජන සෞඛ්‍යය පිලිබඳ දැනුවත් කිරීම්.
- මානසික - ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳව ප්‍රජාව දැනුම්වත් කිරීම තුළින් ආකල්ප/හැසිරීම් වෙනස් කිරීම.

## 3.7 සැසිය - යොමු කළ යුතු ස්ථානවලට වාර්තා කිරීමේ ක්‍රමවේදය සකස් කිරීම.

කාලය - පැය 1

මෙම සැසියේදී විමසා බලන්නේ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ වින්දිතයන්ට සහන සැලසීමේ ක්‍රියාවලියේ දී පැහැදිලි, සහ මනා ලෙස අන්තර් සම්බන්ධීකරණයකින් යුක්තව අදාල සියළු ආයතන සහ පාර්ශවකරුවන් වෙත වාර්තා කිරීම මගින් ඔවුන්ගේ සේවා සපයා ගැනීමේ ක්‍රමවේදයයි. මෙය සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර ආයතන අතර අන්තර් සම්බන්ධය පිළිබඳ චිත්‍රයක් පළමුව ගොඩනඟා ගත යුතු වේ. සැසිය අවසන් කළ යුත්තේ යම් ප්‍රචණ්ඩ ක්‍රියාවක් වාර්තා වූ විට එය තව දුරටත් කලබැගෑනියක් බවට පත් කර ගැනීම වලකා ගනිමින් ව්‍යාකූලභාවයකින් තොරව වින්දිතයාට සහායවීමට අවශ්‍යය ක්‍රමවේදය තීරණය කිරීමෙනි.

### සැසියේ අරමුණ -

1. වින්දිතයන් සඳහා පැහැදිලි, සරල, පහසුවෙන් සේවා ලබා ගත හැකි, රහස්‍යභාවය සහ ගෞරවය සුරකින ආකාරයෙන් යොමු කළ යුතු ආයතන වෙත වාර්තා කිරීමේ ක්‍රමයක් සකස් කර ගැනීමේ වැදගත්කම අවබෝධ කර ගැනීම.

2. එම ක්‍රමවේදය ඇතුලත් අත්පොතක් හෝ ගොනුවක් සකස් කර ගැනීමේ හැකියාව වර්ධනය කිරීම.

### භූමිකාවන් නිරූපණය:

i. සහභාගීවන්නන්ට එක් එක් චරිතය නිරූපනය වන ආකාරයට පහත නම් සඳහන් ටැග් ලබා දෙන්න. ඔවුන් මෙහිදී එම චරිත රඟපාන පිරිස බව සඳහන් කරන්න.

ii. (දියණිය, මව, පවුලේ වැඩිහිටි කාන්තාවක්, ග්‍රාම නිලධාරීතුමා, පොලීසියේ අදාල විෂය භාර නිලධාරී ආදීන්)

iii. ඔවුන් රවුමට වාඩි කරවන්න. අන් අයට ඒ රවුමෙන් පිටත රැඳී මෙම අවස්ථාව නිරීක්ෂණය කරන ලෙස ඉල්ලා සිටින්න.

iv. නූල් බෝලයක් ගෙන එය වයස අවුරුදු 20 ක් වන දූෂණය ලක් වූ දියණිය ලෙස සඳහන් කරන්න.

v. රවුමෙන් පිට සිට එම නූල් බෝලය මවට (හෝ මෙම අවස්ථාවට මුහුණ දුන් දියණිය එම තත්වය වාර්තා කරන පළමු පුද්ගලයාට) බාර දෙන්න.

vi. ඉන් පසු මවට එම නූල් බෝලයේ කෙලවර හොඳින් අල්ලා ගන්න ලෙස සඳහන් කර ඔබ විසින් පවසන චරිතය වෙත එම නූල් බෝලය විසි කරන ලෙස ඉල්ලා සිටින්න.

vii. ඉන් පසු පහත දැක්වෙන කතාව ඔබ පවසන්න. මේ එක් එක් චරිතය සඳහන් කරන අවස්ථාවේදී එම නූල් බෝලය අත ඇති පුද්ගලයා එහි කොටසක් තම ඇඟිල්ලේ පටල වාගෙන අනික් පුද්ගලයා වෙත නූල් බෝලය යොමු කරන්න.

කතාවේ අවස්ථාවන් මෙසේය,

- මව විසින් තමාගේ දියණිය පවුලේ වැඩිමහළු කාන්තාව වෙත රැගෙන යයි. (මෙහිදී මව විසින් නූල් බෝලයේ කෙලවර තම ඇඟිල්ලේ පටලවාගෙන එය දෙවනුව වැඩිමහළු කාන්තාව වෙත යොමු කළ යුතු වේ)
- වැඩිමහළු කාන්තාව ග්‍රාම නිලධාරී වෙත යයි. (දැන් නූලේ කොටසක් මව සහ වැඩිමහළු කාන්තාවගේ අතේ පටලවාගෙන ඇති අතර ග්‍රාම නිලධාරියා වෙත නූල් බෝලය යොමු වේ)
- ග්‍රාම නිලධාරියා - එය පොලිසියේ කාන්තා අංශයට අදාල නිලධාරියාට යොමු කරයි.

මේ ආදි වශයෙන් කතාව තව දුරටත් පියවර කීපයක් ගොඩනැගිය හැකිය.

දැන් මදකට නවත්වා නූල් මගින් ගොඩනගා ඇති සංකීර්ණ ජාලය නිරීක්ෂණය කරන්න.

- රවුමේ මැද ඔබ දකින්නේ කුමක්ද?
- මේ සියල්ල වින්දිතයාට ප්‍රයෝජනවත්ද? ඇය තව දුරටත් මානසික කම්පනයට පත්වෙයිද?
- එවැනි අවස්ථාවක් ඔබ නියෝජනය කරන සමාජයේ සිදුවිය හැකිද?
- මෙවැනි සංකීර්ණ ජාලයක් අවම කිරීමට කළ හැකි දේ කුමක්ද?
- එම දියණියට තමන් මුහුණ පෑ සිද්ධිය කොපමණ අවස්ථාවක් පවසන්නට සිදු වුණාද?
- එක් එක් චරිතය නිරූපනය කරන පුද්ගලයන් විසින් මේ වූදිතයන්ට කොපමණ අවස්ථාවක් කතා කළාද? - ඔහු හෝ ඇය මේ සිද්ධිය පිළිබඳව අන් අය සමග කතා කළාද? ඔබට මේ සිද්ධියේ විස්තර මතකද?

අවස්ථා නිරූපණය අවසන් කරන්න.

**යොමු කළ යුතු ස්ථානවලට වාර්තා කරන ආකාරය පිළිබඳව කමිටු සාමාජිකයන් විසින් ප්‍රායෝගික සහ නිවැරදි ක්‍රමවේදයක් සකස් කරන්න.**

උදාහරණ;

පහත දක්වා ඇත්තේ එවැනි ප්‍රචණ්ඩ ක්‍රියා වාර්තා කිරීමට ශ්‍රී ලංකාවේ ඇති ආයතනයි. එක් එක් කමිටුව විසින් තම බල ප්‍රදේශයේ පිහිටීම සහ පහසුව අනුව වාර්තා කළ යුතු ආකාරය පිළිබඳව සුදුසු ක්‍රමවේදයක් සකස් කර ගත යුතුය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩ ක්‍රියා වාර්තා කිරීමට සහ සහන සේවා ලබා ගැනීම පිණිස ලංකාවේ රාජ්‍යය සහ රාජ්‍යය නොවන ආයතන කීපයක් ඇත. වාර්තා කිරීමේ ක්‍රමවේදය සකස් කළ යුත්තේ හදිසි අවස්ථා දැනුම්දීමේ දුරකතන අංක, බල ප්‍රදේශයේ අදාල පොලිස් ස්ථානයේ කාන්තාවන් සඳහා විශේෂ වූ අංශය, සහ නීති ආධාර සේවා ආදිය සැලකිල්ලට ගනිමිනි.

## රජය විසින් නිර්දේශිත වාර්තා කිරීමේ ක්‍රමවේදය:

- පොලීසියේ ඇති කාන්තා සහ ළමා අංශය - ලංකාවේ සියළු පොලිස් ස්ථානවල කාන්තාවන්ට සහ දරුවන්ට විශේෂ සේවාවන් ලබාදීමට විශේෂ අංශයක්/මේසයක් වෙන් කළ යුතුය.
- කාන්තාවන් සඳහා වෙන්වූ සහාය දුරකතන අංකය - 1938 - කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යංශය විසින් පැය 24 පුරා ක්‍රියාත්මක වන සහාය දුරකතන අංකය. කාන්තාවන් සහ දරුවන්ට සිදුවන හිංසන මෙම දුරකතන අංකය ඔස්සේ යොමු කළ හැකිය. සේවාව සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි යන භාෂා ත්‍රිත්වයෙන්ම ලබා ගත හැකිය.
- වින්දිත දරුවන්ට සහ කාන්තාවන් සඳහා විශේෂිත පොලිස් කාර්යාංශය (පොලිස් ප්‍රධාන කාර්යාලය) - වින්දිතයන්ට මෙම විශේෂිත ප්‍රධාන කාර්යාලය දුරකතන අංක 011-282-6444 මගින් සම්බන්ධ විය හැකි අතර යම් ප්‍රචණ්ඩ ක්‍රියාවකට ලක් වුණි නම් මෙම විශේෂ කාර්යාංශය විසින් අදාල ප්‍රදේශයේ පොලිස් ස්ථානය හා සම්බන්ධ වී වහා ක්‍රියාත්මක වනු ඇත.
- මිතුරු පියස (පවුල් සෞඛ්‍යය කාර්යාංශය) - මෙම ආයතනය විසින් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට අදාල සිද්ධීන් සඳහා ක්‍රියාත්මක අතර දුරකතන අංක 070-261-1111 මගින් මිතුරු පියස හා සම්බන්ධ විය හැකිය.
- ශ්‍රී ලංකා පොලීසියේ වට්ස්ඇප් දුරකතන අංකය (071-859-8888) - අපරාධ,ආරක්ෂාව පිළිබඳ කරුණු මෙන්ම ප්‍රචණ්ඩ ක්‍රියා ද මෙම දුරකතනයට යොමු කළ හැකිය.

## රාජ්‍යය නොවන සංවිධාන සහ සිවිල් සංවිධාන වෙත වාර්තා කිරීමේ ක්‍රමවේද:

- පැය 24 පුරා ක්‍රියාත්මක වන දුරකතන අංක 077-567-6555 ඔස්සේ වින්දිතයන්ට මෙම රාජ්‍යය නොවන සංවිධානය හා සම්බන්ධ විය හැකිය. මෙම රාජ්‍යය නොවන සංවිධානය සමහර පොලිස් ස්ථාන, රෝහල් ආදියේ ද විශේෂ මේසයක් ස්ථාපනය කර ඇති අතර වින්දිතයන් සඳහා වෙන්වූ ආරක්ෂිත ස්ථාන ද පවත්වාගෙන යයි.

- නීති ආධාර කොමිසම - අඩු ආදායම්ලාභී වින්දිතයන්ට අවශ්‍යය නීති ආධාර ලබාදීම මෙම කොමිසම මගින් සිදු කෙරේ. මෙම කොමිසම මගින් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා, නඩත්තු නඩු ආදිය වෙනුවෙන් නීති ආධාර ලබාදෙන අතර මෙහිදී ආදායම් තත්වයන් සලකා නොබැලේ. ලංකාව පුරාම කොමිසමේ කාර්යාල පිහිටා ඇත.

## වෙනත් සේවාවන් : වින්දිතයන්ට සේවා සපයන වෙනත් ආයතන

- **මානසික සෞඛ්‍යය සහන සේවා** - ජාතික මානසික සෞඛ්‍යය සේවාව විසින් ළමා සහ කාන්තා අමාත්‍යාංශය හරහා දුරකතන අංක 1938 ඔස්සේ අවශ්‍යය සේවා සපයයි.

- **මනෝ උපදේශන සේවාවන්** - ශ්‍රී ලංකා සුමිත්‍රයෝ (දුරකතන අංක 076-752-0620) සහ ලංකා ලයිෆ් ලයින් - 1375 අංක ඔස්සේ මනෝ උපදේශන සේවාවන් ලබා ගත හැකි අතර මෙහිදී සේවා ලබා ගන්නන්ගේ රහස්‍යභාවය සුරැකේ.

## ප්‍රජා දැනුම්වත් කිරීම සහ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම:

පළාත් පාලන ආයතනය විසින් ලබාදෙන මේ විශේෂ සේවාව පිළිබඳව ප්‍රමාණවත් ලෙස ප්‍රජාව දැනුම්වත් කළ යුතු වේ.

මෙහිදී සහන සේවා ලබා ගැනීමට ගත යුතු පියවර පිළිබඳව සැකෙවින් තොරතුරු ඇතුලත් අත්පත්‍රිකා, පෝස්ටර්, වැනි දෑ සභාවේ ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛා කාර්යාලවල, ප්‍රජා ශාලා, පුස්තකාල වැනි පොදු ස්ථානවල ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රජාවට ලබා ගත හැකි අයුරින් තැබිය යුතුය.

සභාව විසින් මෙම සේවාව දැනුම්වත් කිරීම පිණිස කොට්ඨාස මට්ටමේ රැස්වීම් පැවැත්විය යුතු අතර මෙහිදී කාන්තා කමිටුවේ මේ සඳහා වගකීම් දරණ සභිකවරියන්/නිලධාරීන් ගේ දුරකතන සහ වාර්තා කිරීමේ ක්‍රමවේදය පිළිබඳව ප්‍රජාව දැනුම්වත් කළ යුතු වේ.

කාන්තා කමිටුවේ අදාල නිලධාරීන්ගේ යම් වෙනසක් සිදුවූ අවස්ථාවේ දී තොරතුරු යාවත්කාලීන කිරීමට ද පියවර ගත යුතු වේ.

ප්‍රකාශනය

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය

අංක 296/2C, ශාන්ති මාවත, කොළඹ 06, ශ්‍රී ලංකාව.

+94 11 2810685 +94 11 2810685 info@fslga.lk www.Fslga.lk

FSLGA
FEDERATION OF SRI LANKAN LOCAL GOVERNMENT AUTHORITIES

FCM FEDERATION OF CANADIAN MUNICIPALITIES FÉDÉRATION CANADIENNE DES MUNICIPALITÉS

In partnership with Canada